

වාර්ෂික වාර්තාව-2023

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

අපනයනකරුවන් සඳහා රැකවරණය

වෙනත් රටවල් වෙත යවන ලද භාණ්ඩ හා සේවාවල වටිනාකම අපනයන දත්ත පිළිබිඹු වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනය වන්නේ ඇඟලුම්, තේ, රබර් සහ ආශ්‍රිත නිපයුම්ය. මෙම සම්ප්‍රදායික අපනයන්ට අමතරව සේවා අපනයන සඳහා තවදුරටත් සහාය දීමට අප බලපොරොත්තුවෙමු. මෙම සේවා සඳහා ඇපාරා ඇප සහතිකය, අපනයන සේවා සැපයුම්, පුරස්කාර, බලපත්‍ර ගාස්තු සහ මෘදුකාංග, ඉදිකිරීම්, මූල්‍ය, තොරතුරු ආදි විවිධ සේවා ඇතුලත් වේ. වර්තමානයෙදි අගය එකතුකල කෘෂිකාර් මික හා කාර්මික නිෂ්පාදන සහා සේවා ආශ්‍රිත අපනයන ප්‍රවර්ධනය උදෙසා රජය විසින් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ පිහිටුවා ඇත.අපනයන ආර්ථිකය දියුණු කිරිම උදෙසා අවශ්‍ය තොරතුරු,සහාය සහ රැකවරණය ලබාදීමට අපනයන රක්ෂණ සංස්ථාව කටයුතු කරනු ලබයි.

පටුන

07 දැක්ම සහ මෙහෙවර

09 සභාපතිතුමාගේ සමාලෝචනය

13 වසර පහක කාර්යසාධන සාරාංශය

ආයතනය පිලිබඳ

16 අධ්‍යක්ෂක මණ්ඩලය

19 ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

20 මධ්‍ය කළමණාකාරීත්වය

21 සේවාවන්

26 ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂන සංස්ථාවේ කාර්යසාධනය

35 විගණන කමිටු වාර්තාව

මූල්‍ය වාර්තා

41 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

42 ආදායම් ප්‍රකාශය

43 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

44 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

45 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ සටහන්

52 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන වාර්තාව

60 විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) යනු 1978 අංක 15 දරන පනතින් ස්ථාපිත කරන ලද ආයතනයක් වන අතර, එම ආයතනයේ මෙහෙයුම් සඳහා මහ පෙන්වීමේ අරමුණු ද එකී පනතෙහි දක්වා තිබේ.

SLECIC

අපගේ දැක්ම

"ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමෙහිලා උත්ප්‍රේරකය වීම"



අපගේ මෙහෙවර

"අපනයනකරුවන්, බැංකු, අනෙකුත් මූල්‍ය ආයතන හා ආනයනකරුවන් වෙත තොරතුරු, සහාය හා ආරක්ෂාව සැපයීමේ ව්‍යාපාරික කාර්යයයේ අප විසින් නියැලී සිටින්නෙමු. පුද්ගල අවශ්‍යතානුකූලවම සැකසූ විශිෂ්ටතම සේවා පිරිනැමීම ඔස්සේ පාරිභෝගික අපේක්ෂා අභිභවා යෑමට අප විසින් ප්‍රයත්න දරනු ලැබේ"

සභාපතිතුමාගේ සමාලෝචනය



2023 මූල්‍ය වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මා විසින් ඉදිරිපත් කරනු ලබන්නේ හදපිරි සතුටිනි. අනපේක්ෂිත අභියෝග මධ්‍යයේ වුව ද, ජාත්‍යන්තර වෙළඳාම සඳහා සහාය හා පහසුකම් සැලසීමේ අපගේ අඛණ්ඩ කැපවීම සම්බන්ධයෙන් 2023 වර්ෂය සාක්ෂි දරනු ඇත.

යුක්‍රේනයේ පවතින යුද්ධය, ගාසා තීරයේ යුද්ධමය තත්ත්වය සහ යුරෝපය වෙත පවතින ආසන්නතම නාවික මාර්ගය අවහිර කරමින් රතු මුහුදේ පවතින අර්බුදය හේතුවෙන් යුරෝපයේ දැනට පවතින ආර්ථික පසුබෑමේ සිට ගෝලීය වශයෙන් සිදු වූ විවිධ කැළඹිලිකාරී වාතාවරණයන් 2023 වර්ෂය ඉදිරියේ සනිටුහන් විය. අනෙකුත් භූ දේශපාලනික පීඩන සහ ආර්ථික අවිනිශ්චිතතා හේතුවෙන් ඇති වූ නැව්ගත කාල සීමාව වැඩිවීම සහ නැව් ගාස්තු ඉහළ යෑම අපගේ අපනයනකරුවන්ගේ උනන්දුව හීනකරවන ලදී.

අපනයනකරුවන් වෙත සහාය ලබාදීම: ඉහත වාතාවරණය හේතුවෙන් ඇති වූ බාධා මධ්‍යයේ, සැපයුම් දාම අවහිරතාවල සිට ඉල්ලුමෙහි විචලනයන් දක්වා වූ අභියෝග රාශියකට අපනයනකරුවන් විසින් මුහුණ දෙන ලදී. මීට ප්‍රතිචාර වශයෙන්, නම්‍යශීලී හා එක් එක් අවශ්‍යතානුකූලව සකස් කළ රක්ෂණ විසඳුම් අපනයනකරුවන් වෙත පිරිනමමින් අපනයනකරුවන් සඳහා සහාය ලබාදෙන අපගේ ප්‍රයත්නයන් දෙගුණ කරන ලදී. වෙළඳ ලැබිය යුතු දෑ රක්ෂණය කිරීම, දේශපාලනික අවදානම් අවම කිරීම, හෝ අපගේ පූර්ව සහ පසු ඇපකරණ ඔස්සේ මූල්‍යයන කටයුතු සඳහා පහසුකම් සැපයීම හෝ වේවා සෑම කාර්යයකදීම, අපගේ සේවාදායකයන් සමඟ සිටිමින් සහාය ලබාදීම සිදුකරන ලදී.

ඉහත කරුණුවලට අමතරව, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත්වීම ඔස්සේ ද අපනයනකරුවන්ගේ ආදායම වෙත බලපෑමක් ඇති වූ අතර, ඒ අනුව අපගේ රක්ෂණ ඔප්පුවල වාරික මත සෘණාත්මක බලපෑමක් ඇති විය. අඩුවීමට අමතරව, වාරික අපගේ විදේශ විනිමය ශේෂයන්ගේ විනිමය අනුපාතිකවලට අදාළව රු.මිලියන 294.01ක පාඩුවක් දැරීමට ද අපට සිදුවිය. 2022 වර්ෂයේ දී මීට අදාළ අගය වූයේ රු.බිලියන 1ක ලාභයකි.

මෙම බාධා හමුවේ වුව ද, පූර්ණ රක්ෂණ විසඳුම් ඔස්සේ අපනයන ප්‍රවර්ධනය කිරීමේ හා සුරක්ෂිත කිරීමේ අපගේ මෙහෙවර ඉටුකිරීම සංස්ථාව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය තුළ වුව ද, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සවිමත් මූල්‍ය තත්ත්වයක් පවත්වාගෙන ගිය බව වාර්තාකරනුයේ සතුටිනි. ක්‍රමෝපායික ආයෝජන සමඟ එකතු වූ අපගේ විචක්ෂණශීලි අවදානම් කළමනාකරණ පරිවයන් ඔස්සේ පීඩනය මැඩපවත්වා සවිමත් මූල්‍ය ප්‍රතිඵල ලබාගැනීමට අපට හැකිවිය. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වසර 45ක් වූ කාල සීමාව තුළ පෙර කිසිදු අවස්ථාවක වාර්තා නොවූ රුපියල් බිලියන 1.2 ක ඉහළතම ශුද්ධ ආදායමක් අප විසින් සාක්ෂාත් කරගනු ලැබීය.

2023 වර්ෂයේ සිට 2027 වර්ෂය දක්වා වසර 5ක් ආවරණය වන ක්‍රමෝපායික ව්‍යාපාර සැලැස්ම අප විසින් සකස් කරන ලදී. මීට අනුකූලව අපගේ සේවා අනාගතයේ දී පුළුල් කිරීම සඳහා, අපගේ ප්‍රකාශිත ප්‍රාග්ධනය වර්ෂය තුළ දී රු.මිලියන 30සිට රු.මිලියන 150 දක්වා වැඩිකරන ලදී. රු.මිලියන 281.57 ක ආදායම් බදුවලට අමතරව, වර්ෂය තුළ භාණ්ඩාගාරය වෙත අපගේ දායකත්වය රු.මිලියන 500ක් විය.

ශ්‍රී ලාංකිකයන් විසින් විදේශ රටවල රැකියා සෙවීමේ මෑතකාලීන ප්‍රවණතාවය හේතුවෙන් මෙරටින් බැහැර වීමේ පිරිවැය ආවරණය කරමින් ක්‍රියාත්මක ඇපයුරා බැංකු ඇපකර යෝජනා ක්‍රමය (APARA) ඔස්සේ විදේශ රැකියා වෙළඳපොළ ග්‍රහණය කරගැනීමේ අවස්ථාවක් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව වෙත නිර්මාණය කර දී තිබේ. මේ තුළින් මීට පෙර වර්ෂයේ වාර්තා කළ රු.මිලියන 13.31ට සාපේක්ෂව මෙම වර්ෂයේ දී රු. මිලියන 80 ක කැපි පෙනන ආදායමක් පෙන්නුම් කෙරේ.

කාර්ය මණ්ඩලය: 56ක් වශයෙන් පැවති අපගේ අනුමත කාර්ය මණ්ඩලය 2023 අප්‍රේල් මාසය වනවිට 19ක් දක්වා අඩුවී තිබුණි. කාර්ය මණ්ඩලය 50 දක්වා අඩුකරමින් අපගේ බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුමත කරවා ගැනීමට අපට හැකි වූ අතර, මූල්‍ය, මානව සම්පත් සහ පරිපාලන අංශ වෙත අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ආරම්භ කරන ලදී. 2023 වර්ෂය අවසානය වන විට කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 30ක් ලෙස පැවතිණි. ප්‍රධාන වශයෙන් ඉතිරි පිරිස මෙහෙයුම්/ හිමිකම් අංශ වෙත බඳවා ගැනීමට ද විකුණුම් සහ අලෙවි අංශ සවිමත් කරගැනීමට ද තවමත් අපට අවශ්‍ය වී තිබේ. 2024 පළමු කාර්තුව තුළ දී මෙම බඳවා ගැනීම් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. කණ්ඩායම් හැඟීම සහ කාර්ය මණ්ඩලයේ උද්යෝගය වැඩිදියුණු කිරීමේ අභිප්‍රාය පෙරදැරිව ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට දීර්ඝ කාලයක් තුළ අභිමිවී තිබූ වාර්ෂික චාරිකාව යළි සිදුකරන ලදී. මීට අමතරව, සේවකයන් සඳහා ධනාත්මක කාර්යාලීය පරිසරයක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 45 වැනි සංවත්සරය සැමරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවකයන් වෙත ඉහළ මට්ටමේ දිවා ආහාරයක් සංවිධානය කරන ලදී.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්: කාර්යක්ෂම කාර්යාල ජාලයක් නිර්මාණය කිරීම සඳහා නවීනතම Power Edge R650 සර්වර් යන්ත්‍රයක් මිලදී ගැනීම ඔස්සේ දැනට පවතින PC Network සර්වරය වැඩිදියුණු කරන ලද අතර කඩදාසි භාවිතයෙන් තොර සමාජයක් වෙත අඩිතාලම දමමින් අපනයනකරුවන් වෙත යාවත්කාලීන තොරතුරු ලබාගැනීමට සහ සිය ප්‍රකාශනයන් ස්වකීය කාර්ය තුළම සිටිමින් ඇතුළත් කිරීමට අවස්ථාව සැලසෙන පරිදි වන වෙබ් අඩවියක් සැකසීම සඳහා නිසිලෙස ක්‍රියාත්මක නොවී පැවති ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ www.slecic.lk වෙබ් අඩවිය වැඩිදියුණු කරන ලදී.

අලෙවිකරණ කටයුතු: ශ්‍රී ලංකාවේ බොහෝ අපනයනකරුවන්ට, විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ අංශයට ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව පැවතීම සහ එහි සේවය පිළිබඳ දැනුවත්බවක් නොමැති බව ප්‍රධාන කොටම සනාථ වී ඇති හෙයින්, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා අලෙවි ක්‍රියාකාරකම් කිහිපයක් දියත් කරන ලදී. පහත සඳහන් කර තිබෙනුයේ මෙම වසර තුළ දියත් කරන ලද ක්‍රියාකාරකම් අතුරින් කිහිපයකි.

1. තෝරාගත් ප්‍රවෘත්ති පත්‍ර සහ ඩිජිටල් ප්‍රවෘත්ති පත්‍රවල වෙබ් අඩවිවල වෙළඳ ප්‍රචාරණ කටයුතු ආරම්භ කිරීම.
2. අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලයේ අපනයන සම්මාන උත්සවයේ දී සහ ඔවුන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී ක්‍රමෝපායික පාර්ශවකරුවීම.
3. තේ අපනයනකරුවන්ගේ සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම සඳහා සහභාගීවීම සහ ඊට සම-අනුග්‍රහය දැක්වීම.
4. කුළුබඩු මණ්ඩලය, කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදන සැකසුම්කරුවන්ගේ හා වෙළඳුන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම් සඳහා සහභාගීවීම සහ ඒවාට සම-අනුග්‍රහය දැක්වීම
5. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කරගෙන ශ්‍රී ලංකාවේ සෑම ස්ථානයක් වෙතම පණිවිඩය ව්‍යාප්ත කිරීම කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ අත්වැල් බැඳගැනීම සේම දිවයින පුරා සියලුම අදාළ අංශ ඉලක්ක කරගෙන ඔවුන්ගේ වැඩමුළු සඳහා සහභාගීවීම.
6. රූපවාහිනියේ Connect Sri Lanka වැඩසටහන, හරිත ටීවී නාළිකාව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සුභාරති වැඩසටහන වැනි රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් සඳහා සහභාගීවීම.

2022 වර්ෂයේ දී නව රක්ෂණ සහතික පත්‍ර 6ක් පමණක් නිකුත් කළ නමුදු, 2023 වර්ෂයේ දී මෙම අලෙවිකරණ ප්‍රයත්නයන් හේතුවෙන් ආසන්න වශයෙන් අපනයනකරුවන් 35 දෙනෙකු පමණ ඉලක්ක කර ප්‍රචාරණ කටයුතු සිදුකළ හැකිවූ අතර එමඟින් නව රක්ෂණ සහතික පත්‍ර 18ක් නිකුත් කිරීමට උපකාරී විය.

අපගේ අරමුණුවලට අනුගතව අපගේ පොරොන්දු ඵලෙසම ඉටුකරමින් සමාලෝචිත වර්ෂය තුළ දී අපනයනකරුවන් සිවු දෙනෙකු වෙත රු.මිලියන 40.5ක හිමිකම් ගෙවීම අප විසින් සිදුකරන ලදී.

අනාගතය පිළිබඳ පිරික්සීමේ දී, දැනට පවත්නා අභියෝග සහ පැන නගින අවස්ථා සමඟින් ගෝලීය ආර්ථික වාතාවරණය අවිනිශ්චිතව පවතී. එසේ වුව ද, අපගේ ඔරොත්තුදීමේ ශක්‍යතාවය සහිත ව්‍යාපාරික ආකෘතිය, කැපවීමැති කාර්ය මණ්ඩලය, විශිෂ්ටත්වය සඳහා වන නොසැලෙන කැපවීම සමඟින් අප ඉදිරියේ පවතින මාර්ගයේ සාර්ථක ආකාරයෙන් කටයුතු කළ හැකිබවට මා තුළ විශ්වාසයක් පවතී. තිරසර වර්ධනයක් සහ අපගේ ආර්ථිකය සඳහා දිගු කාලීන වටිනාකමක් ඇතිකරලීම උදෙසා අප නව්‍යතාවය, අනුගතවීම සහ අපගේ පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවය අඛණ්ඩව සිදුකරන්නෙමු.


සමාප්තියේ දී, අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ අනෙකුත් සාමාජිකයන්, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ සෑම අයෙකුම, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්, එම අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ පාරිභෝගිකයන් වෙත ඔවුන්ගේ අඛණ්ඩ විශ්වාසය සහ සහාය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි. 2023 වර්ෂයේ දී අප සැමගේ සාමූහිකත්වය තුළින් සැලකිය යුතු ජයග්‍රහණයන් සාක්ෂාත් කරගනු ලැබූ අතර අපගේ ඉදිරි ගමන සම්බන්ධයෙන් මම අපේක්ෂා සහගතව පසුවෙන්නෙමි. අපගේ සංස්ථාව නැමති වෘත්තාන්තයේ ඉදිරි පරිච්ඡේදය වෙත අප විසින් පියමනින මේ අවස්ථාවේ දී, අඛණ්ඩ විශිෂ්ටත්වය වෙනුවෙන් අපි සැම එක්සත්ව සිටිමු.


සෙනරත් දේවේන්ද්‍ර *(FCA FCMA)*
සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව


වසර පහක තොරතුරු සැකෙවින්


කාර්ය සාධන සමාලෝචනය (රු.මිලියන වලින්)


2018-2022 දක්වා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය (රු.මිලියන වලින්)					
විස්තරය	2019	2020	2021	2022	2023
රක්ෂිත ව්‍යාපාර	35,740	37,108	49,299	70,002	55,220
දළ රක්ෂණ වාරික ආදායම	226.00	204.00	261.00	436.00	418.00
මෙහෙයුම් වියදම්	180.00	177.00	233.00	170.00	165.00
මෙහෙයුම් අතිරික්තය/(පාඩුව)	277.00	288.00	334.00	1,889.00	1,055.00
ආයෝජන ආදායම	217.00	215.00	209.00	528.00	787.00
ශුද්ධ අතිරික්තය/(පාඩුව)	242.00	223.00	249.00	1,643.00	480.00
ප්‍රාග්ධනය හා සංචිත	2,624.00	2,826.00	3,073.00	4,660.00	4,365.00
බදු හා අයබදු	38.00	90.00	111.00	309.00	281.00

















වාරික ආදායම


ලාභ ද නොමැති පාඩු ද නොමැති යන ප්‍රතිපත්තිය පදනම් කරගෙන වාරික ගෙවීම් අනුපාතික තීරණය කෙරේ. ගනුදෙනු සිදුකරන ප්‍රධාන වෙළඳපොළවල් සමග සිසුයෙන් දුර්වල වෙමින් පවතින ව්‍යාපාරික වාතාවරණය හමුවේ වුව ද, අසීරු ආර්ථික කාල පරිච්ඡේදයක් තුළ සිය සේවාදායකයන් වන දේශීය අපනයනකරුවන්ට තරහකාරී ආකාරයෙන් පැවතීම සඳහා සහායක් වීමේ අරමුණින් සංස්ථාව විසින් රටවල් කාණ්ඩකරණයේ දී එකම වර්ගීකරණයක් අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. එසේ වුව ද, score card based model ලෙස හැඳින්වෙන ආකෘතිය යොදා ගෙන පසුගිය වසර දෙක මුළුල්ලේම විකුණුම්කරුගේ රක්ෂණ වගකීම භාරගැනීමේ අවදානම් තක්සේරුව ශක්තිමත් කරන ලදී. ඊට පෙර වර්ෂයේ අනුරූපී අගය වන රු. මිලියන 435.56ට සාපේක්ෂව, සංස්ථාව විසින් 2023 වර්ෂයේ දී වාරික ආදායම වශයෙන් රු.මිලියන 411.93ක් උපයා තිබේ

මුළු ආදායම

වාරික ආදායම, අනෙකුත් මෙහෙයුම් ආදායම් හා ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම්වලින් මුළු ආදායම සමන්විත වන අතර, 2022 වර්ෂයේ මුළු ආදායම වූ රු. මිලියන 973.20ට සාපේක්ෂව 2023 වර්ෂයේ මුළු ආදායම රු.මිලියන 1,220.88කි.

මුළු වියදම

සෘජු වියදම් හා අනෙකුත් කළමනාකරණ වියදම්වලින් මුළු වියදම සමන්විත වේ. වියදම්වල හිමිකම් වියදම් හා තත්ත්ව වාර්තා පිරිවැය අන්තර්ගත අතර අනෙකුත් වියදම් වනුයේ ආයතනික වියදම්, පරිපාලන වියදම්, අලෙවි සහ වෙළඳ ප්‍රචාරණ වියදම් සහ මූල්‍ය ගාස්තු වේ. 2022 වර්ෂයේ වාර්තා වූ රු.මිලියන 176.09 සාපේක්ෂව 2023 වර්ෂය සඳහා මුළු වියදම රු.මිලියන 165.26කි.



රජයේ ආදායම සඳහා දායකත්වය

සිය පැවැත්ම සඳහා භාණ්ඩාගාරයෙන් සැපයෙන මුදල් මත යැපෙමින් පොදු ජනතාව සඳහා සුවිසල් පීඩනයක් වීමේ මූලාශ්‍රයක් බවට පත්වන බවට රජයේ සංස්ථා වෙත විවේචන එල්ල වෙන පරිසරයක දී, වගකීම් සහගත රජය සතු ව්‍යවසායක් වශයෙන් භාණ්ඩාගාරයට බරක් නොවෙමින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් රජයේ ආදායම සඳහා අඛණ්ඩවම දායකත්වය දරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් මස නිකුත් කළ රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ ප්‍රකාරව, රජය සතු ව්‍යවසායන් විසින් ආයෝජන මත සැලකිය යුතු ප්‍රතිලාභ ජනනය කිරීමත්, අතිරික්තයේ හෝ ලාභයෙන් කොටසක් බදු හෝ ලාභාංශ වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලට/ කොටස් හිමියන් වෙත ලබාදීමත් අපේක්ෂා කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ දී, සංස්ථාව විසින් රු. මිලියන 500 කින් දායකත්වය ලබා දී තිබේ.

වසර ගණනාවක් තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සිය ඉපැයීම්වලින් අනාගත වගකීම් දැරීම සඳහා ප්‍රමාණවත් අරමුදලක් ගොඩනගා ගැනීම අවශ්‍යව තිබූ අතර, එකී අරමුණට පහසුකම් සැලසීමේ අභිප්‍රායෙන් එවකට සිටි ව්‍යවස්ථා සම්පාදකයන් විසින් මෙම සංස්ථාව විසින් රජය වෙත විවිධ බදු වර්ග ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලදී. එසේ වුව ද, බදු අධිකාරීන් විසින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව අපනයන කටයුතු සඳහා සහාය ලබාදෙන නියෝජිතායතනයක් ලෙස නොසලකන බැවින් සංස්ථාව විසින් අඛණ්ඩව රජයේ විවිධ බදු සඳහා දායකත්වය දරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය





සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂක

සෙනරත් දෙවේන්ද්‍ර මහතා, බහුජාතික, ජාත්‍යන්තර සහ ප්‍රධාන බහු සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස වසර **35**කට අධික පලපුරුද්දක් සහිත මොහු වරලත් සහ කළමනාකරණ ගණකාධිකාරී ආයතනවල සාමාජිකයෙකු වේ. අයිබීඑම් ආයතනයෙන් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ එච්එස්බීසී වෙතින් දේශසීමා මායිම් ඔස්සේ භාණ්ඩාගාර කළමනාකරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් පුහුණුවක් ලබාගෙන තිබේ. මීට අමතරව, මූල්‍ය විශේෂඥයෙකු වශයෙන් සහ ජාත්‍යන්තර අලවේකරණය පිළිබඳ අත්දැකීම් ද සහිත මොහු බහුවිධ විෂය ක්ෂේත්‍රවල දැනුමැති වෘත්තිකයෙකු වශයෙන් සැලකිය හැකි ය.

ඔහුගේ වෘත්තීය කාලසීමාව තුළ දී ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විවිධ අංශ ආවරණය වන පරිද්දෙන් විවිධ බහුජාතික සමාගම්, ජාත්‍යන්තර සහ ප්‍රධාන පෙළේ ප්‍රමුඛතම සමාගම් සඳහා සිය සේවය ලබාදී තිබේ. මීට පෙර දරන ලද තනතුර වූයේ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත වැවිලි සහ විනෝදාස්වාද අංශවල ලැයිස්තුගත සමාගම් සමූහයක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී තනතුර යි. 2023 අප්‍රේල් සිට ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් පත් කෙරිණි.



ඒ.ඒ.එම්.තසීම් මහතා වසර 31කට අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයේ නියුතු අතර දැනට සහකාර අධිපති තනතුරේ සේවය කරයි. මොහු ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සඳහා ලේකම්වරයා වශයෙන් ද කටයුතු කරනු ලැබේ. මෙම පත්වීමට පෙර, මොහු වසර 4ක් පුරා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරෙහි සේවය කළ අතර මෙරට බැංකු ක්ෂේත්‍රය නියාමනය සහ අධීක්ෂණය සඳහා සහ බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වගකීම දරන ලදී. තව ද, මොහු ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ වශයෙන් ද කටයුතු කළ අතර විදේශ සංචිත ආයෝජනය සහ කළමනාකරණය සහ විනිමය අනුපාතිකය කළමනාකරණය සඳහා වගකීම දරන ලදී.

ගෙවීම් පද්ධති ක්ෂේත්‍රයේ අත්දැකීම් සහ දැනුම ද ලබා ඇති තසීම් මහතා ජාතික නිෂ්කාශන ආයතනය වන ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද කටයුතු කර තිබෙන අතර චෙක්පත් මූර්තනය සහ ලෝපනය කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දායකත්වය ලබාදෙන ලදී. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද මොහු කටයුතු කරන ලදී. දැනට මොහු ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උප සභාපති වශයෙන් ද කටයුතු කරනු ලැබේ.

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන තසීම් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන තිබේ. ඇමරිකා එක්සත් ජනපදයේ, බර්ක්ලීහි කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ හාස් ස්කූල් ඔෆ් බිස්නස් වෙතින් රන් සංචිත කළමනාකරණය පිළිබඳ වැඩසටහනක් ද හදාරා නිමකර තිබේ. ජෝන් එෆ් කෙනඩි ස්කූල් ඔෆ් ගවන්මන්ට් විසින් පවත්වන ලද නායකයන් සඳහා විධායක වැඩසටහන ද සාර්ථක ලෙස නිමාකරමින් ඇමරිකා එක්සත් ජනපදයේ හාවඩ් විශ්වවිද්‍යාලයේ ද විද්‍යාර්ථියෙකු ද වේ.



ඒ.ඒ.අයි.දිල්රුක්ෂි මිය වසර තුනකට වැඩි කාලයක් මුළුල්ලේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වරයෙකු ලෙස සේවය කරනු ලැබේ. මෙම පත්වීමට ලැබීමට පෙරාතුව මැය වසර තුනක් රජයේ විගණන සේවයේ නිලධාරිනියක වශයෙන් කටයුතු කර තිබෙන අතර රාජ්‍ය අංශයේ ආයතන නියාමනය සහ අධීක්ෂණය කිරීමේ කටයුතු සඳහා වගකීම දරන ලදී. තවද, මැය රජයේ ගණකාධිකාරී ස්වයේ වසර 19 කට අධික කාලයක් සේවය කර තිබේ.

සිය මූලික උපාධිය ලෙස කැළණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී විශේෂ උපාධිය පළමු පෙළ සාමාර්ථයක් සමගින් ලබාගෙන ඇති ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වේ. තව ද කැළණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමි ය.



ප්‍රියන්ත පෙරේරා මහතා 2021 සැප්තැම්බර් මාසයේ දී සාමාන්‍ය රක්ෂණ අංශයේ ප්‍රධාන නිලධාරී වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට එක්විය. මෙම ක්ෂේත්‍රයේ වසර 38කට වැඩි පලපුරුද්දක් සහිත මොහු සාමාන්‍ය රක්ෂණ කටයුතු පිළිබඳ අංශයේ දිගු කාලයක් නිරතව සිටින වෘත්තිකයෙකු වේ. 1985 දී මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනයේ රක්ෂණ අංශය තුළින් සිය රැකියාව ආරම්භ කරන ලද අතර මෙම අංශයේ විවිධ ආයතනවල වගකිවයුතු තනතුරු රාශියක් දරා තිබේ.

ප්‍රියන්ත මහතා වෘත්තීය කාල සීමාව තුළ, ප්‍රතිරක්ෂණ කටයුතු, හිමිකම්, නැවත රක්ෂණය සහ රක්ෂණ කළඹ කළමනාකරණය වැනි අංශ ආවරණය කරමින් විවිධ කළමනාකරණ තනතුරු හොබවා තිබෙන අතර මීට පෙර ෆෙයා ෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගමේ ප්‍රධාන තාක්ෂණික නිලධාරි ලෙස කටයුතු කරන ලදී.
ප්‍රියන්ත මහතා වරලත් රක්ෂණකරුවෙකු වන අතර එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය දරයි. එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්රෝපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය ලබා තිබේ.



B.M.S.බණ්ඩාර මහත්මිය,1995 වර්ෂයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක්වූ ඇය සහකාර ඉඩම් කොමසාරිස්වරියක වශයෙන් ඉඩම් කොමිෂන් සභාවේ සේවය කරන ලදී. ඉන් අනතුරුව අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවය කර තිබේ.

ඇය විසින් 1991 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ලබාගෙන තිබේ.

ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය



C.J. සෙනරත් දේවේන්ද්‍ර මහතා	-	සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ *(FCA,FCMA)*
A.K.A.Y. තරංග මහතා	-	සාමාන්‍යාධිකාරී (වැ.බ.) *(Bsc (MGPP),Attorney at Law)*
රවීන් ඕවිටිගල මහතා	-	සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය *(ACMA, MBS(UOC), B.com(Sp) ,SAT,APFA)*
R.M.U.N. පීරිස් මහත්මිය	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-මෙහෙයුම් *(Attorney at Law)*
මොහාන් සිල්වා මහතා	-	සහකාර සාමාන්‍යාධිකාරී- අලෙවිකරණ *(B.Sc(Hons),MBA(PIM),AACS,MCIM(UK))*

මධ්‍ය කළමණාකාරීත්වය



D.V.කහවිට මහතා - අභ්‍යන්තර විගණක
CA (Corporate Level),AAT (Passed Finalist),HDAF

A.H. ඕබඩගේ මහතා - කළමනාකරු - තොරතුරු තාක්ෂණ
C/EH,MCSE,BSC inHardware Eng. (Middlesex University)

P.N.H.R.සිල්වා මහතා - කළමනාකරු-අලෙවිකරණ
Dip.in Bus.Mgt,(NIBM),Dip in Marketing,(NIBM)

S. මාතරගේ මහත්මිය - සහකාර කළමණාකරු මානව සම්පත් සහ පරිපාලන
(B.Sc.(UJSP),MHRM(UOC)

I.A.අමරතුංග මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
N.D. in Sec,Dip.in Sec.,NCSP

K.G.A.ප්‍රියංගිකා මහත්මිය - සහකාර කළමනාකරු-මෙහෙයුම්
BA (Economics Special)(UOC)

W.A.W.L.ජයරත්න මෙනෙවිය - සහකාර කළමනාකරු-මෙහෙයුම්(පැමිණ නැත)
B.Sc Accounting(Special)(UJSP)

D.S.A.ප්‍රනාන්දු - සහකාර කළමනාකරු-මුදල්(පැමිණ නැත)
(HNDA,PGDBF(UOC),MPacc(UJSP),CMA (Strategic Level))

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ නිමැවුම් සහ සේවා

මෙරට අපනයන ප්‍රජාවේ සුභසිද්ධිය වෙනුවෙන් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සපයනු ලබන සේවාවලින් ප්‍රධානතම වනුයේ විකුණුම්කරුගේ අවදානම හා බැංකු සඳහා ණය ඇපකර වශයෙන් සන්නාමගත අපනයන ණය රක්ෂණය වේ. වැඩි බාධාවකින් සහ අපහසුතාවයකින් තොරව වාණිජ බැංකුවලින් ණය ලබාගැනීම පහසුකරමින් අපනයනකරුවන්ගේ මෙහෙයුම් කටයුතුවල විෂය පථය පුළුල් කරගැනීම සඳහා හැකියාව ලබාදෙන අතරම, අපගේ සේවාවලින් අපනයනකරුවන්ගේ මූල්‍ය සුරක්ෂිතභාවය ආරක්ෂා කෙරේ.

විකුණුම්කරුගේ අවදානම

අපනයන ප්‍රජාව සඳහා වන අපගේ නිමැවුම් හා සේවාවල මූලික වැදගත් කොටස වනුයේ විකුණුම්කරුගේ අවදානම යි. වාණිජ හෝ දේශපාලන අවදානමක් හේතුවෙන් විදේශීය ගැනුම්කරු විසින් ගෙවීම් සිදු නොකිරීමේ හෝ ගෙවීම් ප්‍රමාද කිරීමේ අවදානමින් අපනයනකරු ආරක්ෂාකර ගැනීමේ කාර්යය මෙමගින් ඉටු වේ.

වාණිජ අවදානම්

- බුන්වත්බව හා බංකොලොත්බව
- ගෙවීම් පැහැර හැරීම
- ගිවිසුම් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම

දේශපාලනික අවදානම්

- විදේශ විනිමය ප්‍රේෂණය කිරීම් ප්‍රමාද කිරීම
- ආනයන බලපත්‍ර අහෝසි කිරීම
- ආනයන තහනම් කිරීම
- ගෙවීම් තාවකාලිකව නතර කිරීම
- යුද්ධ, විප්ලව, කැරලි හා ස්වාභාවික ව්‍යසනයන්

සංස්ථාව විසින් පිරිනමනු ලබන පුළුල් පරාසයක රක්ෂණ ඔප්පු අතුරින්, පූර්ණ පිරිවැටුම් ආවරණ රක්ෂණ ඔප්පු වඩාත් ජනප්‍රිය වී තිබේ. විශේෂිත අංශවල එකී අංශවලට ආවේණික අවශ්‍යතා සපුරාලීම සඳහා එකී අවශ්‍යතාවලට අනුකූලවම සකස්කරන ලද පහසුකම් ද පවතී.

අපනයනකරුවන් සඳහා පිරිනමනු ලබන අපනයන ණය රක්ෂණ කාණ්ඩ පහත පරිදි වේ.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - පූර්ණ පිරිවැටුම - සියලු ගැනුම්කරුවන්
වාණිජ අවදානම් හා දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි. ගෙවීම කල්දැමීමේ කොන්දේසි මත පවතින සම්පූර්ණ නැව් භාණ්ඩ තොග අප විසින් මේ යටතේ ආවරණය කරනු ලැබේ.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - ගැනුම්කරුට නිශ්චිත වූ
එක් හෝ ඊට වැඩි නිශ්චිත ගැනුම්කරුවන්ගේ වාණිජ අවදානම් හා දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - රටකට නිශ්චිත වූ
යම් නිශ්චිත රටක ගැනුම්කරුවන්ගේ වාණිජ අවදානම් හා දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - දේශපාලනික අවදානම
යම් නිශ්චිත රටක දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - ගෝලීය රක්ෂණ ආවරණය
ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතු කරන අක් වෙරළ අපනයන සමාගම් සඳහා පිරිනැමෙන රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - පාලිත සමාගමක අවදානම
මව් සමාගම ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති, වෙනත් රටක සංස්ථාපිත කර ඇති පාලිත සමාගමක අපනයනකරුවන්ගේ අවදානම ආවරණය කරන රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - අවසන් ගැනුම්කරුවන් ආවරණය කිරීම
ගැනුම්කරුගේ රටෙහි දී සම්පූර්ණයෙන් හිමිකම් දරන පාලිත සමාගමක් සඳහා නැව් භාණ්ඩ තොගය සකස් කර ඇති විටක දී, අවසන් ගැනුම්කරුවන්ගේ වාණිජ හා දේශපාලනික අවදානම් ආවරණය කරමින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - පැවරූ හෝ භාරදුන් භාණ්ඩ තොග
පැවරූ හෝ භාරදුන් භාණ්ඩ තොගවලට අදාළ වන වාණිජ හා දේශපාලනික අවදානම්වලින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - අන්තරාල වෙළඳාම
අන්තරාල වෙළඳාමට අදාළව පැන නඟින වාණිජ හා දේශපාලනික අවදානම්වලින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - විකුණුම්කරුගේ අවදානම් සඳහා පූර්ණ සේවා රක්ෂණ ඔප්පුව
වාණිජ හා දේශපාලනික අවදානම්වලින් සේවා අංශයේ ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - දේශීය ණය රක්ෂණය
ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ ගැනුම්කරුවන් වෙත භාණ්ඩ පිටත් කිරීමට හා සේවා සැපයීමට අදාළ වාණිජ අවදානම්වලින් රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

බැංකු වෙත පිරිනමන අපනයන ණය ඇපකර
අපනයනකරුවන්ගේ කල්ගත වූ ගෙවීම් පැහැර හැරීම් සහ බුන්වත්බව හේතුවෙන් අපනයනකරු විසින් ලබාගෙන ඇති අත්තිකාරම් සඳහා මුදල් නොගෙවීමෙන් බැංකු විසින් දැරිය යුතු පාඩු මෙම බැංකු වෙත පිරිනමන ණය ඇපකර මගින් ලිහිල් කෙරේ. බැංකු වෙත ලබාදෙන අපගේ ණය ඇපකර හේතුවෙන් අපනයනකරුවන් විසින් බැංකු වෙත ලබාදිය යුතු ඇපකර හා මිල අධික තැන්පතුවල අවශ්‍යතාවය ඉවත්වෙන අතර අපනයනකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සැලසේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් අපනයනකරුවන්ගේ පාර්ශවයෙන් ඇතිවන බුන්වත්බව හෝ කල්ගත වූ ගෙවීම් පැහැර හැරීම් හේතුවෙන් බැංකු විසින් දැරිය යුතු පාඩුවෙන් 66.66% සිට 85% දක්වා ප්‍රමාණයක් ප්‍රතිපූරණය කිරීම සඳහා වගකීම දරයි.

බැංකු වෙත පිරිනමන අපනයන ණය ඇපකර කාණ්ඩ පහත පරිදි වේ.

පූර්ව නැවිගත කිරීම් ණය ඇපකර (තනි පුද්ගල)
තනි පුද්ගල ප්‍රතිපාර්ශව අවදානම ශ්‍රී ලංකා රුපියල්වලින් සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදලකින් 66.66% ක් දක්වා ආවරණය කළ හැකි ය. අමුද්‍රව්‍ය මිලදී ගැනීම්, භාණ්ඩ නිෂ්පාදනය හා සැකසීම හා අපනයන ඇසුරුම් කිරීම සඳහා

ලැබී ඇති ණයවර ලිපි හෝ තහවුරු කළ ඇණවුම් සඳහා අපනයනකරුවන් වෙත මූල්‍ය සමාගම් විසින් පූර්ව නැවිගත කිරීමේ පහසුකම් සැලස්වීම සඳහා මෙම ඇපකර මඟින් පහසුකම් සැලසේ.

පශ්චාත් නැවිගත කිරීම් ණය ඇපකර (තනි පුද්ගල)
මෙම ඇපකර වාණිජ බැංකු වෙත ප්‍රදානය කෙරේ. පශ්චාත් නැවිගත කිරීමේ අවස්ථාවේ දී අපනයන බිල්පත් මිලදී ගැනුම්, ගනුදෙනු හෝ වට්ටම් කිරීම් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යයනය කරගැනීම සඳහා අපනයනකරුවන්ට බැංකු වෙත ප්‍රවේශය වීමට හැකිවීම තහවුරු කිරීම මෙමගින් සිදු වේ.

පූර්ණ පිරිවැටුම පූර්ව/ පශ්චාත් නැවිගත කිරීම් ණය ඇපකරය
මෙම ඇපකර මගින් ඉහළ රක්ෂණ ආවරණයක් සහ අඩු රක්ෂණ වාරික අනුපාතිකයක් යටතේ අපනයනකරු වෙත හෝ චක්‍ර අපනයනකරුවෙකු වෙත පූර්ව/පශ්චාත් නැවිගත කිරීම් අත්තිකාරම් ආකාරයෙන් ප්‍රදානය කරන සම්පූර්ණ ණය ප්‍රමාණය ආවරණය කිරීම සඳහා බැංකු වෙත පහසුකම් සලස්වයි.

අපනයන නිෂ්පාදන ණය ඇපකර
ඇපකර සම්බන්ධයෙන් වැඩි අවධාරණය කිරීමකින් තොරව, අපනයනකරුවන් වෙනුවෙන් භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදකයන් සඳහා කාරක ප්‍රාග්ධනය මූල්‍යයනය කිරීම සඳහා මෙමගින් මූල්‍ය ආයතන වෙත පහසුකම් සලස්වනු ලැබේ.

අපනයන කාර්යසාධන ඇපකර
ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ සහ සේවා අපනයන කිරීම සඳහා එළඹී ඇති ගිවිසුම්වල නිසි පරිද්දෙන් ඉටු කිරීම සම්බන්ධයෙන් සහතික වෙමින් විදේශීය ගැනුම්කරුවන් හෝ රජයේ අධිකාරීන් වෙත බැංකු විසින් සිය සේවාදායකයන් වෙත නිකුත් කරන ඇපකර සහ බැඳුම්කර වෙනුවෙන් එකී වාණිජ බැංකු වෙත සංස්ථාව විසින් නිකුත් කරන ප්‍රති ඇපකරයකි. ඉදිකිරීම් කටයුතු මෙන්ම භාණ්ඩ හා සේවා අපනයන ඔස්සේ ප්‍රමිතිගත අපනයන කොන්ත්‍රාත් මීට ඇතුළත් වේ.

භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ගේ නිසි කාර්යසාධනය ආවරණය කරන අපනයන කාර්යසාධන ණය ඇපකර
භාණ්ඩ ප්‍රවාහනය කරන්නෙකු වෙත ගුවන් සේවා සමාගමක් විසින් ලබා දෙන ණය පහසුකම වෙනුවෙන් බැංකුවක් විසින් නිකුත් කරන බැංකු ඇපකරය සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් බැංකුව වෙත නිකුත්කරන ප්‍රති ඇපකරයකි.

ATA Carnet System ආවරණය කරනු ලබන අපනයන කාර්යසාධන ණය ඇපකර
ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයෙන් (ICC) අපනයනකරුවන් සඳහා ATA Carnet ලේඛන ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත මෙම ඇපකර නිකුත් කරනු ලැබේ. ATA Carnet යනු යම් නිශ්චිත කාර්යයක් වෙනුවෙන් යම් නිශ්චිත කාල සීමාවක් සඳහා බදු රහිතව තාවකාලිකව භාණ්ඩ අපනයනය සඳහා අවසර ලබාදෙන ජාත්‍යන්තර රේගු ලේඛනයකි.

රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන් සඳහා ගුවන්ගමන් වියදම් ආවරණය කරගැනීම සඳහා "ඇපාරා" බැංකු ඇපකරය
රැකියා සඳහා විදෙස්ගත වන ශ්‍රී ලාංකිකයන් සඳහා ගුවන් ගතවීමට පූර්වයෙන් ලබාදෙන සමස්ත ණය ආවරණය සඳහා බැංකු වෙත ලබාදෙන ඇපකරයකි.

අනෙකුත් සේවා

Biz info – ණය සහ මූල්‍ය තොරතුරු

මෙම නිමැවුම ඔස්සේ බැංකු අංශය වෙත ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ විදේශීය පාරිභෝගිකයන්ට අදාළ ණය හා තත්ත්ව වාර්තා ඉදිරිපත් කෙරේ. ගෝලීය ණය තොරතුරු ජාලයකින් ලබාගන්නා ණය හා තත්ත්ව වාර්තා සැපයුම්කරු වශයෙන් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ක්‍රියාත්මක වේ. දැනට පවතින විදේශ විනිමය දුෂ්කරතා හේතුවෙන්, අදාළ සේවා සැපයුම්කරුවන් වෙත නියමිත කාලසීමා ඇතුළත බිල්පත් පියවීම සිදුකිරීමේ දුෂ්කරතාවලට සංස්ථාව විසින් මුහුණ පා ඇති බැවින් මූල්‍ය ආයතනය වෙත මෙම සේවාව ලබාදීම තාවකාලිකව අත්හිටුවා තිබේ.

අපනයන ණය රක්ෂණය

“ව්‍යාපාරයක ජීවනාලිය” වශයෙන් ණය විස්තර කරන අතර, සත්‍ය වශයෙන්ම සමාගම්වලට ණය වලින් තොරව සිය කටයුතු පවත්වාගෙන යා නොහැකි ය. සමාගමක වත්කම්වලින් විශාල කොටසක් බොහෝවිට ණය හා බැඳී පවතී. සැබැවින්ම, සමාගමක වත්කම්වලින් සාමාන්‍ය වශයෙන් 40%ක් පමණ සඳහා ණයකරුවන් වෙත බැඳී පවතින බව ඇස්තමේන්තු කර තිබේ. අනෙකුත් ප්‍රතිවාදීන් සමග වෙළඳපොළක තරඟ කිරීමේ දී වෙළඳ කටයුතුවල නිරත සමාගම් විසින් සිය පාරිභෝගිකයන් වෙත ණය ප්‍රදානය කිරීම වැදගත් මෙවලමක් බවට පත්වී තිබේ. ණය සඳහා මිලක් පවතින හෙයින් තරඟය පවතිනුයේ ණය පාදක කරගෙනය. මීට හේතු වනුයේ බහුතරයක් සමාගම් සඳහා මුදල් ප්‍රවාහ තීරණාත්මක බැවිනි. අමුද්‍රව්‍යක් හෝ නිෂ්පාදිතයක් සඳහා යම් කොටසක් මිල දී ගැනීමක් සිදුකළ විට සමාගමෙන් ඉවතට මුදල් යාමක් සිදුවන අතර අලෙවි කිරීමක් හෝ සේවාවක් ලබාදීම සිදුකරන තුරු සමාගම වෙත නැවත මුදල් නොපැමිණේ.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මුදල් ප්‍රවාහ දියුණු කරගැනීම සඳහා සමාගම් විසින් සෑම විටම සිය සැපයුම්කරුවන් වෙතින් ණය කාල සීමාවක් අපේක්ෂා කෙරේ. එසේ වුවද, එවිට මෙයම සැපයුම්කරුගේ මුදල් ප්‍රවාහ කෙරෙහි ද බලපෑමක් ඇති කරයි. එබැවින් ණය වනාහි සරලව කියතොත් අවශ්‍ය සතුරෙකි - ව්‍යාපාරික අවශ්‍යතාවයකි. ගැටලුව වනුයේ අදාළ නියමිත දිනයේ දී එම ගෙවීම නොලැබීම යි. ණය ලබාදෙන සමාගම විසින් උපකල්පනය කරනුයේ අලෙවිය සිදුවන බවත් ඒ අනුව ණය ගැනුම්කරු විසින් ලබාගත් ණය මුදල ඔහුගෙන් ලබාගත හැකි බවත් ය. එකී ගෙවීම ප්‍රමාද වන්නේ නම් හෝ කිසිදු විටක නොගෙවන්නේ නම්, සමාගම විසින් එය දරාගත යුතු අතර ව්‍යාපාරයෙන් ඉවත්වීමට සිදුවීමේ නැඹුරුතාවයක් ද පවතී.

ප්‍රමාද වී ගෙවීම යනු වර්ධනය වෙමින් පවතින ව්‍යාපාරික අවදානමකි. එය සමාගමෙහි මූල්‍ය හා ශේෂ පත්‍රය කෙරෙහි බලපෑමක් ඇතිකරනවා පමණක් නොව එකී ගෙවීම ලබාගැනීම පසුපස හබා යෑම වෙනුවෙන් වැය කළ යුතු කාලය අනුව ද බලපෑමක් ඇති කරයි. ගැනුම්කරුවෙකුගේ බංකොලොත්බව සමාගමකට ඊටත් වඩා හානිදායක වන කරුණකි. එවැනි අවස්ථාවක දී, ණයෙන් කිසිදු කොටසක් , හෝ සැලකිය යුතු කොටසක් ලබාගැනීමේ හැකියාවක් නොමැතිබව ඔප්පු වුවහොත් එකී ණය ප්‍රමාණය කපා හැරීමට සිදුවනු ඇත.

නැවත ආපසු නොලැබෙන ණය සම්බන්ධ ප්‍රතිඵලය වඩාත් හානිදායක වනුයේ ඒ සඳහා ප්‍රධාන සැපයුම්කරුවෙකු අදාළ වන විට ය. නමුත් එකී ණය සම්බන්ධයෙන් ක්‍රමිකව වැඩීමේ බලපෑමක් ද තිබිය හැකි ය. සියලුම ආකාරවලින් එකී ණය ප්‍රමාණය විශාල විය හැකි ය. සමාගම සතුව ගැනුම්කරුවන් සුළු සංඛ්‍යාවක් පමණක් සිටීනම් ගැටලුව තවත් උත්සන්න විය හැකි ය. ව්‍යාප්ත වූ පාරිභෝගික පිරිසක් සිටී නම්, සමාගමට මේ සම්බන්ධයෙන් ඔරොත්තු දීමේ අවස්ථාවක් වනුයේ එහි පාරිභෝගිකයන් අතුරින් අයකු බංකොලොත්බවට පැමිණීම යි.

විභව්‍ය ගැනුම්කරුවන් පිළිබඳ සියලු තොරතුරු දැනගැනීම සමාගම් සඳහා පහසු කාර්යයක් නොවේ. සිය ගිණුම් අනුව මූල්‍ය අංශයෙන් සවිමත් බවට සහ මනා කළමනාකාරිත්වයක් ක්‍රියාත්මක වන බවට පෙන්නුම් කරන සමාගමක් සම්බන්ධයෙන් වුවද, බොහෝ පිරිසකට විස්මිතබවක් දනවන පරිද්දෙන් බුන්වත්බවට පත්විය හැකිය. එසේ වනුයේ වර්තමානයේ ක්‍රියාත්මක වන බොහෝ සමාගම් විසින් බොහෝ ගැටලු සිය සැපයුම්කරුවන්ගෙන් සැඟවීම සඳහා අනුවර්තනය වී ඇති බැවිනි.

ස්වකීය වෙළඳ හවුල්කරුවන් ඇමරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමය වැනි සංවර්ධිත රටවල සිටින බැවින්

බොහෝ සමාගම් විසින් විශ්වාස කරනු ලැබේ. සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග වෙළඳ ගනුදෙනුවල නියුක්ත පිරිස් පමණක් බුන්වත්බවට පත්වෙනු ඇතැයි සිතීම මිත්‍යාවක් පමණකි.

වර්තමාන අභියෝගාත්මක දේශීය හා ගෝලීය ආර්ථික වාතාවරණයක් හමුවේ, අනාගත අවදානම් හඳුනාගැනීම හා කළමනාකරණය කිරීම වනාහී ව්‍යාපාරයක ප්‍රමුඛතම කාර්යයකි. වෙළඳ ණය නොගෙවීම හෝ බුන්වත්බවට පැමිණීම හේතුවෙන් සිදුවන අලාභ ඇතිවීමේ හැකියාවක් හෝ ඇතිවීම නිරන්තරයෙන් සිදුවිය හැකිය . කර්මාන්තයෙන් කර්මාන්තයට හා රටකින් රටකට ණය ගෙවීම් පැහැර හැරීමේ අනුපාතික වාර්ෂිකව වෙනස් වන අතර කිසිදු කර්මාන්තයකට හෝ සමාගමකට වෙළඳ ණය අවදානමෙන් මිදී සිටිය නොහැක.


අභියෝගාත්මක ආර්ථික සමයක දී, ව්‍යාපාරයකට සිය ව්‍යාපාරය සම්බන්ධයෙන් අසීරු තීරණ ගැනීමට සිදුවනු ඇත. සමාගමෙහි මූල්‍ය තත්ත්වය පැහැදිලි පැහැදිලි අවබෝධයක් සහිතව මෙවැනි තීරණ වෙත එළඹීම වඩාත් හිතකර වේ. මෙවැනි තීරණ පැහැදිලි අවබෝධයකින් තොරව ගැනීමෙන් දිගුකාලීන අහිතකර ප්‍රතිඵල උද්ගත විය හැකි ය. දත්ත මත පදනම් වූ තීරණ ගැනීම තුලින් වඩාත් ලාබදායි සහ කාර්යක්ෂම ව්‍යාපාරයකට මඟ පෙන්වීමක් සිදු වේ. රටවල් අතර සිදුකරන වෙළඳ කටයුතුවලදී අවදානම් ලිහිල් කිරීමේ මෙවලමක් වශයෙන් ණය රක්ෂණයේ වටිනාකම සම්බන්ධයෙන් ගෝලීය පිළිගැනීමක් ඇතිවී තිබෙන අතර එකී රක්ෂණ නිමැවුම් සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවී තිබේ.

කෙටිකාලීන ව්‍යාපාරික කටයුතුවල දී, ණය රක්ෂණයක් යටතේ ආවරණය කර ඇති විටක දී, පිරිවැටුම හෝ සිදුකරන නැවිගතකිරීම් වල වටිනාකම ආවරණිත අපනයනවලින් නියෝජනය වේ. නිකුත් කරන ණය සීමා අනුව ආවරණිත අපනයන හඳුනාගත නොහැකි ය. සමාලෝචිත වර්ෂය තුළ දී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සියලුම කාණ්ඩවල අපනයනකරුවන් සඳහා සිය සහාය ලබාදී ඇති අතර, සිය අපනයන ණය රක්ෂණය ඔස්සේ රුපියල් බිලියන හැත්තෑවක වටිනාමකින් යුතු අපනයන සඳහා රක්ෂණ ආවරණය ලබාදී ඇත.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කාර්යසාධනය

වර්තමානයේ දී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් විවිධ වූ "විකුණුම්කරුවන්ගේ අවදානම්" වශයෙන් වූ රක්ෂණ හිමිකම් ඔප්පු යටතේ රටවල් 152 ක දේශපාලනික අවදානම් ආවරණය කෙරේ. ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා සහාය දැක්වීම සඳහා මැදපෙරදිග කලාපයේ පවතින දේශපාලනික අවිනිශ්චිතතා මධ්‍යයේ වුව ද මැදපෙරදිග රටවල් ද මේ යටතේ ආවරණය වන අතර එක් එක් රටවල පවතින අවදානම් පාදක කරගෙන එම රටවල් A1, A2, A3, A4, B, C සහ D වශයෙන් වූ කාණ්ඩ 07කට වර්ගීකරණය කෙරේ. කලාප 8 හරහා 2023 වර්ෂයේ දී පැවති රක්ෂණ ආවරණය පහත ප්‍රස්තාරය මගින් නිරූපණය කෙරේ.

කලාපය	රටවල් සංඛ්‍යාව
අප්‍රිකාව	48
ආසියාව	16
නැගෙනහිර යුරෝපය	16
බටහිර යුරෝපය	21
මධ්‍යම ඇමරිකාව	30
මැද පෙරදිග	5
උතුරු ඇමරිකාව	7
පැසිපික්	9
එකතුව	**152**




ඉහත වගුව අනුව, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් ඉහළ අවදානමක් සහිත අප්‍රිකානු හා මැද පෙරදිග කලාපයේ රටවල් සඳහා මනා ආවරණයක් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. සංස්ථාව විසින් අප්‍රිකානු කලාපයේ රටවල් 48ක්, ආසියානු කලාපයේ රටවල් 16ක්, නැගෙනහිර යුරෝපයේ රටවල් 16ක් හා මැද පෙරදිග රටවල් 5 ක් ආවරණය වන පරිදි රක්ෂණ කටයුතු සිදුකර ඇත. ආත්ම විශ්වාසයෙන් යුතුව ඉහළ ලාභයක් ලැබීම සඳහා අවදානමක් සහිත වෙළඳපොළවල් වෙත ඇතුල්වීම සඳහා කැමැත්තක් දක්වන ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා මෙය හිතකර සලකුණකි.


රක්ෂිත ව්‍යාපාර

අභියෝගාත්මක වෙළඳපොළ පරිසරයක දී, සංස්ථාව විසින් රු.මිලියන 55,545.76 ක ව්‍යාපාර රක්ෂණය කර ඇති බව වාර්තාකර තිබේ. මෙය මීට පෙර වර්ෂයට වඩා රු. මිලියන 14,294.51 ක (හෝ සියයට 20.46) අවප්‍රමාණයවීමකි.

රක්ෂිත ව්‍යාපාර රු.(මිලියන)	
Year	**Total**
2020	37,107.76
2021	49,298.69
2022	69,840.27
2023	55,545.76



2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් රක්ෂණය කර ඇති ව්‍යාපාර මාසික වශයෙන් පහත ප්‍රස්තාරයේ දැක්වේ.




රක්ෂිත ව්‍යාපාර 2020-2023

වර්ෂය	ජන.	පෙබ.	මාර්.	අප්‍රි.	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.
2020	3,348.63	2,699.37	1,964.06	1,219.04	1,965.25	3,083.44	3,676.23	3,999.52	4,294.09	3,839.65	3,490.04	3,528.44
2021	4,729.88	3,788.81	5,415.03	3,412.22	3,720.86	4,053.11	4,222.10	3,989.66	3,811.73	3,992.61	4,064.15	4,098.54
2022	3,842.71	4,114.43	4,897.13	3,837.54	6,636.66	6,937.00	7,647.40	8,281.27	6,418.73	6,399.94	5,561.18	5,428.35
2023	6,092.10	4,105.87	5,366.44	3,607.96	3,926.17	3,663.98	4,511.87	4,382.06	4,674.69	5,116.42	4,931.84	4,461.01

ප්‍රමුඛතම වෙළඳපොළවල් 05

රට	රක්ෂිත ව්‍යාපාර (රු.මිලියන)		
	2022	2023	රක්ෂිත ව්‍යාපාරයේ කොටස
USA	12,493.20	9,466.83	17%
UK	8,333.39	6,623.98	12%
China	5,521.36	3,668.54	7%
Brazil	4,082.04	4,699.85	8%
France	3,975.94	1,660.84	3%
Others	35,596.43	29,425.72	53%
එකතුව	**70,002.36**	**55,545.76**	**100%**



ප්‍රධාන වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, චීනය සහ ප්‍රංශ අපනයන, පිළිවෙලින් 17.04%, 11.93%, 6.60% සහ 2.99% කින් පහත වැටී ඇත. 2022 වසරට සාපේක්ෂව 2023 මූල්‍ය වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන පහත වැටී ඇති අතර, මෙම පහත වැටීමට තවත් ප්‍රධානතම

හේතුව වූයේ 2023 වර්ෂය තුළදී USD වලට සාපේක්ෂව LKR අගය ඉහළ යාම සහ එහි ප්‍රතිඵලයක් ලෙස අපනයනකරුවන්, ඔවුන්ට ලැබෙන සියලුම ඇණවුම් සුරක්ෂිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අපහසු වීමයි.


ඉහත වෙළඳපොළවල් හැරුන විට සමාලෝචිත වර්ෂය තුළ ඕස්ට්‍රේලියාව, ස්පාඤ්ඤය, චෙක් ජනරජය, සවුදි අරාබිය, දකුණු අප්‍රිකාව, බෙල්ජියම, මැලේසියාව, තායිවානය, මොරොක්කෝ, කැනඩාව, කටාර් රාජ්‍යය, ඉන්දුනීසියාව, අසර්බයිජාන්, මෙක්සිකෝව, තායිලන්තය, චිලී රාජ්‍යය, මුරුසිය, ඕස්ට්‍රියාව, මාල දිවයින, කොලොම්බියාව, ඉක්වදෝරය, වියට්නාමය, ටියුනීසියාව, ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ, පකිස්තානය, බංග්ලාදේශය, සැම්බියාව, පිලිපීනය, ලැට්වියා, මොසැම්බික්, පේරු, උරුගුවේ, ලිතුවේනියාව, කොස්ටා-රිකා, පියුර්ටෝ-රිකා, බර්කිනෝ ෆාසෝ, ලිබියාව, පැපුවා නිව්ගිනියාව යන රටවලට අදාළව ද රක්ෂිත ව්‍යාපාරවල සුවිශේෂී වර්ධනයක් වාර්තා වන අතර, පෙර වර්ෂයට සාපේක්ෂව ඉතාලිය, ඉන්දියාව, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, හොංකොං, කුවේට්, සිරියාව යන රටවල්වලදී ආන්තික වර්ධනයක් පමණක් වාර්තා වී තිබේ.

රක්ෂිත ව්‍යාපාරවල ව්‍යාප්තිය - කලාපීය වශයෙන් - 2023

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් 2023 වර්ෂය සිදුකළ රක්ෂිත ව්‍යාපාර කලාප 08ක් හරහා ව්‍යාප්තවී ඇති ආකාරය පහත දැක්වේ.

රක්ෂිත ව්‍යාපාර 2022-2023 (කලාප)

කලාපය	මුළු කොටස		කොටස %
	2022	2023	
බටහිර යුරෝපය	23,344.50	10,630.00	19%
ආසියාව	14,404.83	3,365.84	6%
උතුරු ඇමරිකාව	13,311.65	10,746.74	19%
මධ්‍යයම සහ දකුණු ඇමරිකාව	5,375.05	11,259.08	20%
නැගෙනහිර යුරෝපය	4,566.06	2,101.47	4%
මැද පෙරදිග	3,794.14	625.82	1%
අප්‍රිකාව	3,047.68	12,410.24	22%
පැසිපික්	2,158.44	4,406.43	8%
මුළු එකතුව	**70,002.35**	**55,545.62**	**100%**




පූර්ව වර්ෂය සමග සංසන්දනය කිරීමේ දී රක්ෂිත ව්‍යාපාරවලින් සියයට 19.14ක් බටහිර යුරෝපා රටවලට අදාළ වන අතර වර්ෂය තුළ සියයට 54.46ක අවප්‍රමාණයවීමක් දක්නට ලැබේ. ආසියාව රක්ෂිත ව්‍යාපාරවලින් සියයට 6.06 ක් සඳහා අදාළ වන අතර සමාලෝචිත වර්ෂය තුළ සියයට 76.63ක අවප්‍රමාණයවීමක් දක්නට ලැබේ. රක්ෂිත ව්‍යාපාරවලින් සියයට 19.35ක් උතුරු ඇමරිකානු කලාපයට අදාළ වන අතර, රක්ෂිත ව්‍යාපාරවලින් සියයට 20.27 ක් මධ්‍යම සහා දකුණු ඇමරිකානු කලාපයට අදාළ අතර සමාලෝචිත වර්ෂය තුළ සියයට 109.47ක කැපිපෙනෙන වර්ධනයක් ලබාගෙන තිබේ. එමෙන්ම, රක්ෂිත ව්‍යාපාරවලින් සියයට 22.34 ක් අප්‍රිකානු කලාපය සඳහා අදාළ වන අතර 2023 වර්ෂය තුළ දී සියයට 307.20ක සුවිශේෂී වර්ධනයක් ලබාගෙන තිබේ. සමාලෝචිත වර්ෂයේ දී නැගෙනහිර යුරෝපය, මැද පෙරදිග හා පැසිපික් කලාපය ආදී අනෙකුත් කලාපවල දී මධ්‍යස්ථ වර්ධනයක් දැක්වේ.

තිරසර වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගැනීමට හා අපගේ රක්ෂණ ඔප්පු හිමියන් සඳහා වඩාත් උචිත වෙළඳපොළවල් අත්පත් කරගැනීම සඳහා රටවල් හරහා කාලයත් සමග පුළුල්ව ව්‍යාප්ත වූ අවදානමක් සංස්ථාව සතුව තිබිය යුතු අතර වෙනස්වන සුළු වෙළඳපොළවල්වලට කේන්ද්‍ර වී ඇති අවදානම අඩු කරමින් සවිමත් පදනමකින් මෙහෙයුම් සිදුකිරීම තහවුරු විය යුතු ය

ණය සීමා

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ආවරණ නිකුත් කිරීම, ණයදීමට සුදුසු ගැනුම්කරුවන්ගේ සඳහා ණය සීමා නිකුත් කරමින් ගැනුම්කරුවන්ගේ රක්ෂණ වගකීම් භාරගැනීම ඔස්සේ සංස්ථාව විසින් අඛණ්ඩව අපනයනකරුවන් වෙත සහාය දක්වා තිබේ. රක්ෂණ වගකීම් භාරගැනීමේ තීරණ මූලික වශයෙන් ගැනෙනුයේ ගැනුම්කරු සම්බන්ධයෙන් පවතින තොරතුරු විශ්ලේෂණය කිරීමෙනි. මෙම ක්‍රියාවලිය ප්‍රධාන පියවර තුනක් ඔස්සේ සිදු කෙරේ. පළමු පියවර වනුයේ ගැනුම්කරුගේ විස්තර සටහනක් සකස් කරගැනීමයි. දෙවන පියවර වනුයේ ලකුණු සටහන්පත සකස් කිරීම යි. අවසන් පියවර වනුයේ ගැනුම්කරු සම්බන්ධයෙන් සිදුකරන හෙළිදරවු වලට අදාළව තීරණයකට එළඹීම යි. මූලිකවම අවධානය යොමු වනුයේ වර්තමානයේ පවතින දත්ත මත පදනම්ව, අනාගතයේ දී බැදීමකට අදාළ කාර්යය ඉටු කිරීම සඳහා ගැනුම්කරුට ඇති හැකියාව හඳුනාගැනීම යි. අවදානම් හඳුනාගැනීම, වර්ගීකරණයේ දී ලකුණු සටහන්පත අනුව ගැනුම්කරු මත පවතින අවදානමේ සංසන්දනාත්මක මට්ටම හා ගැනුම්කරු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් මත පදනම්ව ගැනුම්කරු පිළිගනු ලබන්නේ ද යන්න හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය උපකාර වේ.

වර්ෂය	2021	2022	2023
නිකුත් කරන ලද මුළු ණය සීමාවන් රු. මිලියන	4.22	7.1	11.92



විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ආවරණ නිකුත් කිරීම, ණයදීමට සුදුසු ගැනුම්කරුවන්ගේ සඳහා ණය සීමා නිකුත් කරමින් ගැනුම්කරුවන්ගේ රක්ෂණ වගකීම් භාරගැනීම ඔස්සේ සංස්ථාව විසින් අඛණ්ඩව අපනයනකරුවන් වෙත සහාය දක්වා තිබේ. රක්ෂණ වගකීම් භාරගැනීමේ තීරණ මූලික වශයෙන් ගැනෙනුයේ ගැනුම්කරු සම්බන්ධයෙන් පවතින තොරතුරු විශ්ලේෂණය කිරීමෙනි. මෙම ක්‍රියාවලිය ප්‍රධාන පියවර තුනක් ඔස්සේ සිදු කෙරේ. පළමු පියවර වනුයේ ගැනුම්කරුගේ විස්තර සටහනක් සකස් කරගැනීමයි. දෙවන පියවර වනුයේ ලකුණු සටහන්පත සකස් කිරීම යි. අවසන් පියවර වනුයේ ගැනුම්කරු සම්බන්ධයෙන් සිදුකරන හෙළිදරවු වලට අදාළව තීරණයකට එළඹීම යි. මූලිකවම අවධානය යොමු වනුයේ වර්තමානයේ පවතින දත්ත මත පදනම්ව, අනාගතයේ දී බැදීමකට අදාළ කාර්යය ඉටු කිරීම සඳහා ගැනුම්කරුට ඇති හැකියාව හඳුනාගැනීම යි. අවදානම් හඳුනාගැනීම, වර්ගීකරණයේ දී ලකුණු සටහන්පත අනුව ගැනුම්කරු මත පවතින අවදානමේ සංසන්දනාත්මක මට්ටම හා ගැනුම්කරු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් මත පදනම්ව ගැනුම්කරු පිළිගනු ලබන්නේ ද යන්න හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය උපකාර වේ.
රක්ෂණ කාර්යයේ නියැලෙන පිරිස් ප්‍රාරක්ෂණ අධිකාරින් වෙත යොමුකරන අතර ඔවුන්ගේ මට්ටම හා පලපුරුද්ද අනුව ඔවුන්ට නිකුත් කළ හැකි ප්‍රමාණ සීමා කරනු ලැබේ. 2023 වර්ෂයේ දී රු. බිලියන 11.92ක වටිනාකමක් දරන ගැනුම්කරු වගකීම් සීමා (BLL) 474ක් නිකුත් කර ඇති අතර මීට සාපේක්ෂව 2022 වර්ෂයේ දී පවතිනුයේ රු. බිලියන 7.74කි.

අපනයන ණය ඇපකර

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අපනයන ණය ඇපකර ඔස්සේ අපනයනකරුවන් වෙත සත්‍ය වශයෙන්ම අරමුදල් සැපයීමකට අදාළ නොවේ. අපනයනකරුවන් සඳහා මූල්‍යයනය කටයුතු සිදුකිරීමෙන් සිදුවන පාඩු වලට එරෙහිව අපනයන මූල්‍යයන බැංකු ආරක්ෂා කිරීම මෙයින් සිදු වේ. මූල්‍ය ආයතන සඳහා අවශ්‍ය සහාය ලබාදීම ඔස්සේ, ඔවුන් අපනයන ක්ෂේත්‍රය සඳහා වඩාත් සක්‍රිය ආකාරයෙන් මූල්‍යයන කටයුතු සහභාගීවීම දිරිමත් කෙරේ.

ATA Carnet System ඔස්සේ ආවරණය කෙරෙන සෘජු අපනයන කාර්යසාධන ඇපකර

ATA Carnet යනු වෙළඳ සල්පිල්, ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රවර්ධන අරමුණු වෙනුවෙන් භාවිතා කිරීම සඳහා තීරුබදු නිදහස්ව නිශ්චිත කාලසීමාවක් සඳහා භාණ්ඩ සහ වාණිජ සාම්පල තාවකාලිකව ආනයනය සඳහා අවසර ලබාදෙන ජාත්‍යන්තර රේගු ලේඛන වේ.

ATA Carnet මගින් වාණිජ සාම්පල, ඉදිරිපත් කිරීම් හෝ වෙළඳ සල්පිල්, ප්‍රදර්ශන හා එසමාන අවස්ථා සඳහා වෘත්තීය උපකරණ සහ භාණ්ඩ ආවරණය වේ. අපනයනකරුවෙකු වාණිජ සාම්පල් සහ වෙළඳ ප්‍රදර්ශන සඳහා ප්‍රදර්ශන භාණ්ඩ රැගෙන එක් රටකින් තවත් රටකට යෑමට අපේක්ෂා කරන්නේ නම්, ATA Carnet හරහා රේගු නිෂ්කාශන කටයුතු සඳහා වැයවන ඔහුගේ/ ඇයගේ කාලය ඉතිරි කරන අතර සංචාරයද වේගවත් කර දේ.

ATA Carnet භාවිතාකරුවන්

ATA Carnet භාවිතා කරන්නන් තනි පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් විය හැකි ය.

- සංචාරක ව්‍යාපාරික/ අලෙවි විධායකයින්
- කාර්මික ශිල්පීන්
- වෙළඳ ප්‍රදර්ශකයින් සහ චිත්‍රපටි කණ්ඩායම්, ශල්‍ය වෛද්‍යවරුන්, කලා ශිල්පීන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවරුන්, අධ්‍යාපඥයින්, විනෝදාස්වාදය සැපයුම්කරුවන් ආදී තනි වෘත්තිකයින් හෝ කණ්ඩායම්.
- වෙනත් ඕනෑම තැනැත්තෙකු විසින් Carnet භාවිතා කිරීමට අවශ්‍ය කෙරේ නම්, ඔහු වෙත බලය පවරා දෙමින් Carnet දරන්නා විසින් නිකුත් කරන ලද ලිපියක් රැගෙන යා යුතු ය.

ATA Carnet System ඔස්සේ ආවරණය කෙරෙන සෘජු අපනයන කාර්යසාධන ඇපකර ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත නිකුත් කරන අතර, ඇපකර සුරක්ෂණයක් රහිතව ATA Carnet රේගු ලේඛන අපනයනකරුවන්ට, විශේෂයෙන් මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන්ට ලබාගත හැකි ය.

මෙම රේගු ලේඛනය මගින් අපනයනකරුවන්ට විදේශයන්හි පැවැත්වෙන වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගීවීමේ හැකියාව ලබාදෙන අතර අපනයන කොන්ත්‍රාත් ලබාගෙන ලාභ උපරිම කරගැනීමේ අවස්ථාව උදා කෙරේ. සංස්ථාව විසින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත නිකුත් කල හැක්කේ එක් සෘජු ඇපකරයක් පමණි.

මෙරටින් බැහැරවීමේ පිරිවැය - ඇපාරා

සංක්‍රමික සේවකයන් සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් මෙරටින් බැහැර වීමේ පිරිවැය ආවරණය කරමින් බැංකු ඇපකර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. සංක්‍රමික සේවකයන්ට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා වාණිජ බැංකු විසින් ලබාදෙන අත්තිකාරම් ආවරණය කිරීම සඳහා මෙය 1992 වර්ෂයේ හඳුන්වා දෙනු ලැබූ අතර මෙම අංශය සඳහා බැංකු විසින් පහසුකම් සැලසීමේ දී අවම ලේඛන අවශ්‍යතාවයක් සහිත හා බැංකුවල අවදානම දරා සිටින සමස්ත පිරිවැටුම් ණය ඇපකර යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ..

ඇපාරා යෝජනා ක්‍රමය ඔස්සේ මෙරට සිටින බලාපොරොත්තු සහගත පුරවැසියන් වෙත විදේශ රැකියා ලබාගැනීමට හා දුගීබවෙන් මිදීමේ අවස්ථාව සලස්වයි. අපේක්ෂා සපිරි ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරගැනීම සඳහා සහ මෙරට ආර්ථික දියුණුව සඳහා දායකවීමේ අවස්ථාව ලබා දීමට සංස්ථාව කැමැත්තෙන් පසුවෙන අතර එමඟින් ප්‍රේෂණ වැඩිවී විදේශ විනිමය සංචිත ද වර්ධනය වනු ඇත.

සමාලෝචිත කාල සීමාව තුළ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් අයදුම්කරුවන් 1151 දෙනෙකු සඳහා මූල්‍ය ආයතනවලින් රු.මිලියන 1,468.46ක බැංකු ණය ලබාගැනීම සඳහා සහාය වී ඇති අතර සියලුම පළාත්වල ශ්‍රී ලාංකිකයන්ට රැකියා සඳහා විදෙස්ගත වීමේ අවස්ථාව සඳහා පහසුකම් සලසා ඇත. සියලු නිපුණතා මට්ටම් හා විවිධ රැකියා අවස්ථා ලොවපුරා ස්ථාන රාශියක දී ලැබී ඇත. සංස්ථාවේ ආවරණය බහුලව පවතිනුයේ අග්නි දිග ආසියානු කලාපයේ ය

ආරම්භයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් අයදුම්කරුවන් 23,523 දෙනෙකු සඳහා මූල්‍ය ආයතනවලින් රු.මිලියන 4,467.60ක බැංකු ණය ලබාගැනීම සඳහා සහාය වී ඇති අතර සියලුම පළාත්වල ශ්‍රී ලාංකිකයන්ට රැකියා සඳහා විදෙස්ගත වීමේ අවස්ථාව සඳහා පහසුකම් සලසා ඇත.

ආරම්භයේ සිට මේ දක්වා, අයදුම්කරුවන් 1397 දෙනෙකු විසින් මූල්‍ය ආයතන වෙත බැංකු ණය ගෙවීම පැහැර හැර තිබේ.

වර්ෂය	නිකුත් කළ සංඛ්‍යාව	වටිනාකම (රු.)
1992-2006	9,800	696.57
2007-2023	15,766	3,771.03
Total	**25,566**	**4,467.60**

ජාත්‍යන්තර සබඳතා:

ආරක්ෂණවාදය, සැකමුසුබව හා අවිනිශ්චිතබව ඉහළ යමින් පවතින කාලවකවානුවක, ගෝලීය සබඳතා ඉදිරියට ගෙනයෑම, සවිමත් කිරීම හා රැකගැනීම වඩාත් වැදගත් වේ. මෙරට පැවැති ආර්ථික තත්වය හේතුවෙන් 2023 වර්ෂයේ පැවති ජාත්‍යන්තර රැස්වීම් හා අවස්ථා සඳහා පුද්ගලයන් වශයෙන් සහභාගීවීමට නොහැකි වුව ද, ණය හා ආයෝජන රක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (බර්න් සංගමය) සහ අවිධිමත් කලාපීය සහයෝගීතා කණ්ඩායම සමග මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවති සම්මන්ත්‍රණ, සමුළු හා වැඩමුළු සඳහා සහභාගීවෙමින් ජාත්‍යන්තරීකරණය සඳහා ඇති කැපවීම පවත්වා ගන්නා ලදී. මේ ඔස්සේ පොදු ගැටලු, විශේෂයෙන් රක්ෂණය කිරීමේ ක්‍රමවේද හා බොහෝ රටවල ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වටිනා අවස්ථාවන් පිරිනමන ලදී.

ණය හා ආයෝජන රක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය

අපනයන ණය හා ආයෝජන රක්ෂණ ක්ෂේත්‍රය සඳහා පවතින ප්‍රධානතම ජාත්‍යන්තර සංවිධානය වන ණය හා ආයෝජන රක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සංස්ථාව ද සාමාජිකයෙකු වේ. සාමාජිකයන් වනුයේ ජාතික අපනයන සහ ආයෝජන සඳහා සහාය ලබාදීමේ අරමුණැති ගෝලීය වශයෙන් අවදානම් කළමනාකරණ විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලික සමාගම් සහ රජයේ සහයෝගය ලබන අපනයන ණය නියෝජිතායතන වේ.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව යනු රට තුළ අපනයන සංවර්ධනය කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ බලය පැවරීම සහිත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රජයේ එකම අපනයන ණය නියෝජිතායතනය වන අතර අපනයන ණය රක්ෂණ හා ආයෝජනවලට අදාළ නවතම සංවර්ධන කරුණු හා මනා පරිචයන් සම්බන්ධයෙන් ප්‍රවේශය ලබාගැනීමේ අරමුණැතිව 1983 වර්ෂයේ දී බර්න් සංගමයේ පූර්ණ සාමාජිකත්වය ලබා ඇත.

කලාපීය සහයෝගිතා කණ්ඩායම (RCG)

1986 දී පිහිටුවනු ලැබූ කලාපීය සහයෝගිතා කණ්ඩායම යනු ආසියානු කලාපයේ සාමාජිකයන් අතර ජාත්‍යන්තර සබඳතා වැඩිදියුණු කිරීම සඳහා බර්න් සංගමයේ සාමාජික ආයතන 12ක කණ්ඩායමකි. ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, චීනය, ඉන්දුනීසියාව, ජපානය, මැලේසියාව, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, දකුණු කොරියාව, තායිවානය, තායිලන්තය හා හොංකොං යන රටවල අපනයන ණය නියෝජිතායතනවලින් බර්න් සංගමයේ කලාපීය සහයෝගිතා කණ්ඩායම සමන්විත වේ..

ආසියානු කලාපයේ සාමාජිකයන් අතර ජාත්‍යන්තර සබඳතා වැඩිදියුණු කිරීම උදෙසා මෙම කලාපීය සහයෝගිතා කණ්ඩායම 1986 වර්ෂයේ දී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ද ඇතුළුව ආරම්භ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් ආරම්භ වී තිබේ. HKEC, ECGC, MECIB සහ ECICS මෙහි අනෙකුත් ආරම්භක සාමාජිකයන් වන අතර පළමු රැස්වීම 1986 පෙබරවාරි 15 වැනි දින සිංගප්පූරුවේ දී පවත්වා ඇත.

කලාපීය සහයෝගිතා කණ්ඩායමේ සභාපතිත්වය එහි සාමාජිකයන් සඳහා මාරුවෙන් මාරුවට හිමි වේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් 1993/1994 සහ 2007/2008 කාලසීමාවන් තුළ එහි සභාපතිත්වය දරා ඇත. එහි සභාපතිත්වය දැරූ දෙවන අවස්ථාවේ දී සියලුම ආසියානු අපනයන ණය නියෝජිතායතන එක්රැස්කර ප්‍රධානීන්ගේ වාර්ෂික සමුළුවක් බර්න් සංගමයේ සහභාගිත්වයෙන් ද පැවැත්වීමට හැකිවූ අතර එහිදී අවධානය යොමුවූයේ කලාපීය සාමාජිකයින්ගේ වඩාත් ක්‍රමෝපායික ගැටලුවලට අවධානය යොමුකර කණ්ඩායම තුලින්ම විසඳුම් සෙවීමයි. මෙම සමුළුව සාමාජිකයන් සඳහා ඉතා ප්‍රයෝජනවත් වූ අතර එහිදී සාමාජිකයන්ට අදාළ ගැටලු සාකච්ඡා කරන ලදී. මේ දක්වා ශ්‍රී ලංකාව ද ඇතුළුව, විවිධ සාමාජික රටවල්වලදී වාර්ෂික ප්‍රධානීන්ගේ සමුළු 13ක් පවත්වා ඇත.

ආසියානු ණය පරිපූරක ආයතනික සන්ධානය (ACSIC)

ආසියානු ණය පරිපූරක ආයතනික සන්ධානය (ACSIC) යනු 1987 වර්ෂයේ සිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා පවතින විශාලතම ආසියානු සහයෝගිතා ආයතනය යි. වර්තමානයේ දී, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ද ඇතුළුව සාමාජික රටවල් 12ක සාමාජික ආයතන 17ක් පවතී. සංස්ථාව මෙම සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත්තේ 2016 වර්ෂයේ දී ය.

තොරතුරු හුවමාරුව, සාකච්ඡා සහ ආසියාවේ කුඩා ව්‍යාපාරික ණය පරිරපූක ආයතනවල සේවකයන් අන්තර් මාරුකිරීම් සිදුකරමින් ආසියානු කලාපය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ස්ථාවර ණය පරිපූරක පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම මෙම සන්ධානයේ අරමුණ වේ.

ගෙවන ලද හිමිකම්

හිමිකම් සඳහා ගෙවීම් ඔස්සේ අපගේ අපනයනකරුවන්ට සිය අපනයන කටයුතු අඛණ්ඩව කරගෙන යෑමට රුකුලක් වූ අතර බැංකු විසින් එකී අපනයනකරුවන්ගේ හිමිකම් ගෙවීමට සූදානමින් පසුවිනි. හානි අවස්ථා විශ්ලේෂණයෙන්, ණය රක්ෂණය යටතේ ගෙවන ලද සමස්ත හිමිකම්වලට අදාළව තනි විශාලතම හානි අවස්ථාව වනුයේ කල්ගත වූ ණය ගෙවීම් පැහැර හැරීම් බවට අනාවරණය විය.

රක්ෂිතයා රක්ෂණ කොන්දේසි සමග අනුකූල වීම ඉතා වැදගත් අතර පනවන ලද කොන්දේසි නිරීක්ෂණය කිරීමට අපොහොසත්වීම මත හිමිකම් ප්‍රතික්ෂේප නොවිය යුතු ය. ණය පාලනය හා ණය රක්ෂණ පරිපාටි හා ලේඛණ මෙන්ම අදාළ පරිද්දෙන් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම ද ප්‍රයෝජනවත් වේ. ණය රක්ෂණ ඔප්පුව හා හිමිකම් ලබාදීම් සම්බන්ධ රාජකාරි ඉටුකිරීමේ කටයුතු අවසන් කළ යුතු දින සම්බන්ධයෙන් සිහිකැඳවීම සඳහා මෙය ප්‍රයෝජනවත් වේ. ප්‍රමාණාත්මක තොරතුරු ලිඛිතව අනාවරණය කිරීම ද ඉතා වැදගත් වේ.

2022 රු. මිලියන 66.21ට සාපේක්ෂව මෙම වර්ෂය සඳහා ශුද්ධ හිමිකම් රු.මිලියන 40.92 කි.

ආරම්භයේ සිට ප්‍රවර්තන මූල්‍ය වර්ෂය දක්වා, සංස්ථාව විසින් රු.මිලියන 1,446.22ක වටිනාකමකට හිමිකම් ගෙවා තිබෙන අතර එමගින් වාණිජ අවදානම් අඩු කිරීම සඳහා සංස්ථාවේ කැපවීම පෙන්නුම් කෙරේ. මෙම හිමිකම් ගෙවීම් සිදුකර ඇත්තේ අභ්‍යන්තර වශයෙන් ජනනය වූ අරමුදල් වලින් වන අතර කිසිදු රජයේ අරමුදලක් ඒ සඳහා භාවිතා නොකරන ලදී.

ආයතනික සංස්කෘතිය, පුහුණු හා සංවර්ධන කටයුතු

කාර්ය මණ්ඩලය වෙත එල්ලවන පීඩනයන් මධ්‍යයේ වුව ද, අපනයන ප්‍රජාවට සේවා සැපයීම සම්බන්ධිත සංස්ථාවේ සාර්ථකත්වය සඳහා දායක වී ඇත්තේ කාර්ය මණ්ඩල කැපවීම හා විශේෂඥ දැනුම හා පුද්ගලයන් මත පදනම් වූ ආයතනික සංස්කෘතිය වේ.

ආයතනික සංස්කෘතිය තුලින් කාර්ය මණ්ඩලයේ අදහස් තීරණ ගැනීමේ ක්‍රියාවලියට හා සේවාවල ගුණාත්මකබව වැඩිකිරීමේ නව ප්‍රයත්නයන් වැඩිදියුණු කරගැනීම සඳහා උපයෝගී කරගැනීම දිරිමත් කෙරේ. සමස්තයක් ලෙස එවැනි ප්‍රයත්නයන් හරහා සංස්ථාවේ සුභසාධනය සඳහා කැපවීම හා පුද්ගලික මැදිහත්වීම වැඩිදියුණු කෙරේ.

අපගේ සේවක මණ්ඩලයේ යහසාධනය හා තෘප්තිමත්බව සමඟින් අපේක්ෂිත මට්ටමේ ඵලදායිතාවය හා ප්‍රගාමීබව සංස්ථාවේ මනා ක්‍රියාකාරිත්වය සඳහා සැබැවින්ම අත්‍යවශ්‍ය වේ. එනිසා සංස්ථාව විසින් ඔවුන්ගේ රාජකාරි ජීවිතය සමග පමණක් නොව විනෝදාත්මක/විවේකිබව සම්බන්ධයෙන් ද උනන්දු වේ. එබැවින් නිරන්තරයෙන් මූල්‍ය සහාය සමඟින් කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු සම්බන්යෙන් පුරෝගාමීව කටයුතු කරනු ලැබේ.

ඉදිරි දැක්ම

පසුගිය තෙවසර තුළ ඇතිවූ අහිතකර කම්පනවල සමුච්චිත බලපෑම්, වඩාත් සුවිශේෂීව සැලකූ විට කොවිඩ් 19 වසංගත තත්ත්වය හා රුසියාව විසින් යුක්රේනය ආක්‍රමණය කිරීම, අනපේක්ෂිත ආකාරයෙන් මැද පෙරදිග ගැටුම වැනි සංසිද්ධි සමඟින් ගෝලීය ආර්ථිකය නැවත වරක් ඉතා ඉහළ අවිනිශ්චිත වාතාවරණයක පවතී. බොහෝ ආර්ථිකයන්ගේ උද්ධමනය දශක ගණනාවකින් ඉහළ අගයක් වාර්තා කළ අතර මහ බැංකු විසින් සිය උද්ධමන අපේක්ෂා අදාළ ඉලක්ක වෙත ගෙන ඒම සඳහා සිය ප්‍රතිපත්ති දැඩි කරන ලදී.

අනතුරු ඇඟවීම්

අපනයනකරුවන් විසින් අනතුරු ඇඟවීම් සඳහා සමීප අවධානය යොමුකළ යුතු අතර ඒ සම්බන්ධයෙන් කඩිනමින් ප්‍රතිපියවර අවශ්‍ය පරිදි ගත යුතු ය. අවදානම් සංඥා පහත කවර ආකාරයක් වුව ද විය හැකි ය: වැඩිතොග රැස්කිරීම්, අධික ණයබර, අඛණ්ඩ හානි, නඩු කටයුතු සම්බන්ධයෙන් දැඩි නියුක්තවීම, කොටස් හිමිකරුවන් නිරන්තරයෙන් වෙනස්වීම, මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත්කිරීම ප්‍රමාදවීම, ගෙවීම් ප්‍රමාද කිරීම, දිගු ණය කාල සීමා සඳහා ඉල්ලීම්, ගෙවීම් කොන්දේසි එක්වර වෙනස් කිරීම හා ගෙවීම් කල යුතු දිනය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීම්. ගෙවීම් සිදුකිරීමේ අසිරුතාවයක් ඇතිවුවහොත් අපනයනකරුවන් හානි අවම කරගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු ය. විසඳුම් සඳහා ගැනුම්කරුවන් සමග සාකච්ඡා හෝ නැවත ගෙවීම් සිදුකිරීමේ කාර්ය සටහන් ආදිය ගතයුතු ක්‍රියාමාර්ග වලට ඇතුළත් ය.

ව්‍යාපාර අත්පත් කරගැනීම හා රඳවා ගැනීම

පවතින වෙළඳ පරිසරය අභියෝගාත්මකව පවතින අතර අපනයනකරුවන් විසින් සෑම අවස්ථාවක්ම ලබාගැනීම හා ඔවුන්ගේ ව්‍යාපාර සැනසිලිදායක ස්වභාවයෙන් වැඩිදියුණු කරලීම සඳහා සහාය ලබාදීමට සංස්ථාව විසින් අපේක්ෂා කෙරේ. නව වසරේ දී, සංස්ථාව විසින් බැංකු, වෙළඳ කටයුතු සඳහා සහාය ලබාදෙන සංවිධාන, වෙළඳ හා කාර්මික සංගම් ඇතුළුව සිය ව්‍යාපාරික පාර්ශවකරුවන් සමග සබඳතා හා සහයෝගය සවිමත් කරගැනීම අඛණ්ඩව සිදුකරන අතර තවදුරටත් වැඩි අපනයනකරුවන් පිරිසක් වෙත ළඟාවීම සඳහා ප්‍රචාරණ හා වෙළඳ කටයුතු දියත් කරනු ඇත.

අනාගතය පිළිබඳ විමසිලිමත්බව

ඉදිරි වර්ෂයේදි ද, සංස්ථාව අපනයන ප්‍රජාවන් වෙත අඛණ්ඩව පූර්ණ වශයෙන් කැපවෙන අතර අපනයනකරුවන් සඳහා අවශ්‍ය විශ්වාසනීය ආරක්ෂාවද පිරිනමනු ඇත. භාණ්ඩ අපනයනය හැරුනවිට, සේවා අපනයන ද ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ කටයුතුවල ප්‍රධාන අංගයක් ලෙස සමන්විත වේ.

සුපුරුදු පරිද්දෙන් ගෝලීය අවස්ථා ග්‍රහණයට ගැනීම සඳහා විවිධ වූ සේවා කර්මාන්ත සඳහා අපගේ පූර්ණ සහාය සපයනු ඇත. ලෝක ආර්ථිකය නැවත යථා තත්ත්වයට පැමිණෙන දිනය අවිනිශ්චිත නමුදු, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා ගතික ගෝලීය වෙළඳ වාතාවරණයක දී වුව ද ඉහළ ක්‍රියාකාරිත්වයක් සහිත ආසියානු හා නැඟීඑන වෙළඳපොළවල්වලදී නව අවස්ථා පිරිනැමෙනු ඇති බවට ශුභවාදී ආකල්ප දරනු ලැබේ

මෙම පෙර නොවූ විරූ අභියෝගාත්මක පරිසරය තුළ, සංස්ථාව විසින් නම්‍යශීලි ආකාරයෙන් කටයුතු කරන බව හා ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා ප්‍රශස්තම රක්ෂණ ආවරණ සැපයීම හා ඔවුන්ගේ අවදානම් කළඹ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ට සිය විශ්වාසය රැඳවිය හැකි ය. කාලීන හා ප්‍රමාණවත් ආවරණය, අදාළ වන දේශපාලනික හා ආර්ථික අවදානම් මනාව අවබෝධ කරගැනීම සඳහා සහාය ලබාදීම වැනි ආකාරවලින් නැඟීඑන වෙළඳපොළවල් වෙත සිය ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ සැලසුම් සහිත අපනයනකරුවන් සඳහා වැඩි සහායක් ලබාදීම ද අප විසින් සිදුකරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණන කමිටු වාර්තාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ (SLECIC) විගණන කමිටුව 2002 වර්ෂයේ නොවැම්බර් මාසයේදී බලාත්මක වූ අතර එම කමිටුව සඳහා මුදල් අමාත්‍යාංශය නියෝජනය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු සභාපතීත්වය දරණ ලදී.කමිටුව සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය.ආරාධනා කිරීම් අනුව, නිරීක්ෂකයෙකු වශයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් නියෝජිතයෙකු හා 2023 වසරේ මුල සිට මුදල් අමාත්‍යාංශ නියෝජිතයෙකු ද නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වේ.

කමිටුවේ සාමාජිකයින් පහත දැක්වෙන පරිදි විය : එනම්,

- ඒ.ඒ.අයි.දිල්රුක්ෂි මිය - කමිටුවේ සභාපති , SLECIC අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - මුදල් අමාත්‍යාංශය
- බී.එම්.එස්.බණ්ඩාර මිය - SLECIC අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ, අතිරේක ලේකම් , කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
- ප්‍රියන්ත පෙරේරා මහතා - SLECIC අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ , ප්‍රධාන නිලධාරී - ජීවිත රක්ෂණ , සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

නිරීක්ෂණ නිලධාරීන් :

- සමන්ති විමලවීර මිය - විගණන අධිකාරී, විගණකාධිපති දෙපාර්තමේන්තුව, ජාතික විගණන කාර්යාංශය
- රේණුකා කොළඹගේ මිය - ප්‍රධාන මූල්‍ය නිලධාරී, මුදල් අමාත්‍යාංශය

2023 වර්ෂයේදී විගණන කමිටුව විසින් රැස්වීම් තුනක් පවත්වන ලදී. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් එම කමිටු වෙනුවෙන් නිශ්චිතව දක්වනු ලැබූ යොමු කිරීමේ නියමයන් ප්‍රකාරව එම විගණන කමිටුව ක්‍රියාත්මක විය. මූල්‍ය ප්‍රකාශවල විශ්වසනීයත්වය සහ අව්‍යාජභාවය ප්‍රකාරව, අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාවය මෙන්ම ව්‍යවස්ථාපිත සහ නියාමන නියමයන්ට එකඟව සංස්ථාවේ ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තා කිරීමේ ක්‍රියාවලිය සහ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම පිළිබඳව ස්වකීය වගකීම් ඉටු කිරීමේදී කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වනු ලැබීය.

සැලකිල්ලට භාජනය වූ කාල සීමාව තුළ දී , විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් බාහිර වාර්තා නිතිපතා අධීක්ෂණය කරනු ලැබූ අතර එකී වාර්තාවල අන්තර්ගත නිර්දේශ මත පදනම්ව සංස්ථාවේ අභ්‍යන්තර පාලනයක් විධිමත් කිරීම සඳහා පියවර ගණනාවක් ගනු ලැබීය. අභ්‍යන්තර විගණක විසින් පවත්වනු ලැබූ විගණනයන් හා COPE කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම කමිටුව විසින් අධීක්ෂණය කරන ලදී.

සංස්ථාවට අදාළ වන SLECIC නීති රීති සහ නියෝග වලට එකඟව කමිටුව විසින් විශේෂ අවධාණය කිරීම් සිදු කරනු ලැබූ අතර සෑහීමකට පත්විය හැකි මට්ටමින් එකඟව ක්‍රියාකර ඇද්ද යන්න සහතික කිරීම පිණිස භාණ්ඩාගාරය විසින් නිශ්චිතව දක්වනු ලැබූ චක්‍ර ලේඛ හා නියමයන්ට එකඟව ක්‍රියා කර ඇති ද යන්න අධීක්ෂණය කරන ලදී.

ඒ.ඒ.අයි.දිල්රුක්ෂි
සභාපති - විගණන කමිටුව
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC)

2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ

වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC)

අන්තර්ගතය

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- ආදායම් ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
- ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 වැනි දිනට

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)	සටහන	ප්‍රගවර්තනා වර්ෂය 2023	පූර්ව වර්ෂය 2022
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	9	146,557,087	151,127,335
දිගු කාලීන මූල්‍ය ආයෝජන (වසර 12 වැඩි)	10	384,466,868	8,210,419
මුළු ජංගම නොවන වත්කම්		**531,023,954**	**159,337,754**
ජංගම වත්කම්			
ලිපිද්‍රව්‍ය හා පංරිභෝජික ද්‍රව්‍ය තොග		204,263	822,235
ආයෝජන අරමුදල		2,397,029	1,474,826
වෙළඳ ණයගැති පාලන ගිණුම්		11,699,906	17,774,415
විවිධ ණයකරුවෝ, කැන්පතු සහ පූර්ව ගෙවීම්	11	34,047,683	6,441,402
ලැබිය යුතු අපොළිය	12	432,894,859	461,763,582
කෙටි කාලීන මූල්‍ය ආයෝජන (වසර 12 ඇඩ)	13	4,523,054,416	4,660,927,881
විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් වූ ඉකිරි කිරීමේ ගිණුම්	14	9,881,383	91,002,559
මුදල් හා මුදල් සමාන දෑ	15	16,432,199	32,176,968
මුළු ජංගම වත්කම්		**5,030,611,739**	**5,272,383,869**
මුළු වත්කම්		**5,561,635,694**	**5,431,721,623**
බැඳීකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(ඔබු අංක 04)	150,000,000	30,000,000
සංචිත	(ඔබු අංක 04)	2,320,481,939	2,327,046,250
රඳවාගත් ඉපැයුම්	(ඔබු අංක 04)	1,895,167,402	2,284,894,930
මුළු බැඳීකම්		**4,365,649,342**	**4,641,941,181**
වගකීම්			
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු කාර්ය මණ්ඩල පංරිභෝජික	16	13,466,484	30,010,488
මුළු ජංගම නොවන වගකීම්		**13,466,484**	**30,010,488**
ජංගම වගකීම්			
විවිධ ණය හිමියෝ, උපචිත වියදම් හා ප්‍රතිපාදන	17	661,752,728	237,724,956
ගෙවීමට කිරීමෙන හිමිකම් සඳහා ප්‍රතිපාදන	18	517,807,098	495,877,928
බැංකු අක්තිකාරම්		2,960,041	26,167,070
මුළු ජංගම වගකීම්		**1,182,519,868**	**759,769,954**
මුළු වගකීම්		**1,195,986,352**	**789,780,442**
මුළු වගකීම් හා බැඳීකම්		**5,561,635,694**	**5,431,721,623**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ
ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සහ 1971 අංක 38 දරන මුදල් සභාගේ විධිවිධාන ප්‍රකාරව
මෙම මූල්‍ය ප්‍රකාශන සිද්ධියෙළ කර ඇත.

.....
රසිකා ජයවර්ධන
ගණකාධිකාරී

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් වශයෙන් පවතී.
මෙම මූල්‍ය ප්‍රකාශන සහක් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබනු ලැබේ.

එස් ඩී ඒ දේවේන්ද්‍ර
සභාපති සහ කළමනාකාරිත්ව අධ්‍යක්ෂ

ඒ ඒ එම් කබීම
අධ්‍යක්ෂ

2024 පෙබරවාරි 27

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ආදායම් ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	සටහන	ප්‍රවර්තන වර්ෂය **2023**	පූර්ව වර්ෂය **2022**
ආදායම			
දළ ලිඛිත වාරික	**1**	411,935,492	435,561,804
උපයා නොගත් වාරික සඳහා සංචිතයේ ශුද්ධවෙනස	**1අ**	6,590,611	(3,662,948)
දළ උපයාගත් වාරික		**418,526,103**	**431,898,856**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	**2**	15,251,796	11,909,785
මෙහෙයුම්වලින් ලද මුළු ශුද්ධ ආදායම		**433,777,899**	**443,808,641**
අනෙකුත් ආදායම්			
ආයෝජන ආදායම	**3**	787,110,607	529,400,575
		787,110,607	**529,400,575**
මුළු ශුද්ධ ආදායම		**1,220,888,505**	**973,209,215**
හිමිකම් සහ මෙහෙයුම් වියදම්			
ශුද්ධ හිමිකම්	**4**	62,831,747	66,212,929
තත්ත්ව වාර්තා		6,422,511	5,786,631
ආයතනික වියදම්	**5**	25,104,920	20,613,096
පරිපාලන වියදම්	**6**	61,029,577	69,028,608
විකුණුම් හා අලෙවිකරණ වියදම්	**7**	9,679,877	4,484,083
මූල්‍ය ගාස්තු	**8**	196,844	9,970,160
ශුද්ධ හිමිකම් සහ මෙහෙයුම් වියදම්		**165,265,476**	**176,095,507**
එකතු කළ අගය මත බද්දට පෙර ලාභය/ අලාභය		1,055,623,029	797,113,708
මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද	**8අ**	-	85,864,474
ආදායම් බද්දට පෙර ලාභය		**1,055,623,029**	**711,249,234**
ආදායම් බදු	**8ආ**	281,575,841	182,339,084
බදු පසු ලාභය		**774,047,188**	**528,910,150**
අනෙකුත් ආදායම්/වියදම්			
විනිමය අනුපාතික වෙනස්වීම හේතුවෙන් ලාභය/(අලාභය)		(294,017,104)	1,086,538,807
බදු පසු මුළු විස්තීර්ණ ආදායම		**480,030,084**	**1,615,448,956**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා *(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)*	ප්‍රවර්තන වර්ෂය **2023**	පූර්ව වර්ෂය **2022**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
බදු පෙර ශුද්ධ ලාභය	1,055,623,029	1,797,788,040
ගැලපුම් කළා;		
ක්ෂය කිරීම්	16,346,130	13,584,600
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	2,401,583	18,525,745
හිමිකම් සඳහා ප්‍රතිපාදන	166,611,769	66,212,929
මූල්‍ය සේවා මත වැට බද්ද	-	85,864,474
නොඉපැයූ වාරික සඳහා ගැලපුම්	(6,590,611)	3,662,948
විදේශ විනිමය අනුපාතික ඔස්සේ ලාභය	-	(1,086,538,807)
පූර්ව වර්ෂ ගැලපුම්	(569,757,611)	(91,239,072)
ආයෝජන ආදායම	(787,110,607)	(529,400,575)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**(122,476,318)**	**278,460,284**
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	6,074,509	(473,075,056)
තැන්පතු හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම	(262,956,081)	129,713
වෙළඳ ණයහිමි සහ අනෙකුත් ගෙවිය යුතු වැඩිවීම/(අඩුවීම)	424,027,772	(13,415,768)
පාරිභෝගිකයන් වෙතින් රඳවාගත් නැවත ගෙවිය යුතු තැන්පතු වැඩිවීම/(අඩුවීම)	452,800	106,800
තොග අඩුවීම/ (වැඩිවීම)	617,972	(69,600)
මෙහෙයුම්වලින් ජනනය වූ/ (භාවිතා වන) මුදල්	**45,740,654**	**(207,863,628)**
පාරිතෝෂික ගෙවීම	(2,568,771)	(2,844,252)
හිමිකම් ගෙවීම	(40,574,275)	(4,297,947)
මූල්‍ය සේවා මත ගෙවූ වැට බද්ද	(7,858,426)	(37,122,002)
ගෙවූ ආදායම් බදු	(147,945,211)	(71,349,465)
භාණ්ඩාගාරය වෙත ලෙවූ විශේෂ බද්ද	(500,000,000)	(50,000,000)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/ (භාවිතා වන) ශුද්ධ මුදල්	**(653,206,030)**	**(373,477,294)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(11,775,880)	(926,423)
පොලී ආදායම	787,110,607	529,400,575
ස්ථිර තැන්පතු	(137,873,466)	(132,025,754)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් / (භාවිතා වන) ශුද්ධ මුදල්	**637,461,261**	**396,448,398**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
ලැබූ භාණ්ඩාගාර ණය මුදල්/ නැවත ගෙවීම්	-	-
ප්‍රාග්ධන දායකත්වය	-	-
ණය ආපසු ගෙවීම	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (භාවිතා වන) ශුද්ධ මුදල්	**-**	**-**
මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම	**(15,744,769)**	**22,971,104**
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)	32,176,968	9,205,864
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)	**16,432,199**	**32,176,968**
සටහන අ		
මුදල් හා මුදල් සමාන දෑ		
හැටන් නැෂනල් බැංකුවේ ජංගම ගිණුම්	955,761	1,318,649
හැටන් නැෂනල් බැංකුවේ හර බද්දෙන් නිදහස් ජංගම ගිණුම	605,802	-
හැටන් නැෂනල් බැංකුවේ ඒක්ෂණ තැන්පතු ගිණුම	13,428,928	27,601,615
ලංකා බැංකුවේ ජංගම ගිණුම	1,325,877	3,130,662
මහජන බැංකුවේ ජංගම ගිණුම	113,831	54,764
අතැති මුදල්	2,000	71,278
	16,432,199	**32,176,968**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2023

2023 දෙසැම්බර් 31 වැනි දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	රඳවාගත් ආදායම් රු.	පොදු සංචිතය රු.	ප්‍රත්‍යාගණනික සංචිතය රු.	ආයෝජන අරමුදල රු.	නොඉපැයූ වාරික රු.	එකතුව රු.
2022 ජනවාරි 01 දිනට ශේෂය	30,000,000.00	669,419,673.77	2,157,589,464.84	137,308,408.27	58,507,949.05	20,003,780.27	3,072,829,276.20
							-
ප්‍රත්‍යාගණනික සංචිතයෙන් මාරු කරන ලද			13,291,520.00	(13,291,520.00)	-	-	-
පූර්ව වර්ෂ ගැලපුම්		26,300.01					26,300.01
2022 වර්ෂය සඳහා ශුද්ධ ලාභය		1,615,448,956.48					1,615,448,956.48
2022 වර්ෂය තුළ මාරු කරන ලද				-	-	3,662,948.02	3,662,948.02
2022 වර්ෂය සඳහා විශේෂ බද්ද			(50,000,000.00)				(50,000,000.00)
							-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	30,000,000.00	2,284,894,930.26	2,120,880,984.84	124,016,888.27	58,507,949.05	23,666,728.29	4,641,967,480.71
ප්‍රත්‍යාගණනික සංචිතයෙන් මාරු කරන ලද			-	-			-
භාණ්ඩාගාර ආයෝජන	120,000,000.00						120,000,000.00
ගැලපුම්		(569,757,611.38)					(569,757,611.38)
2023 වර්ෂය සඳහා ශුද්ධ ලාභය		480,030,083.55		-	-	-	480,030,083.55
2023 වර්ෂය තුළ මාරු කරන ලද							-
2023 වර්ෂය සඳහා විශේෂ බද්ද		(300,000,000.00)				(6,590,611.36)	(306,590,611.36)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	150,000,000.00	1,895,167,402.43	2,120,880,984.84	124,016,888.27	58,507,949.05	17,076,116.93	4,365,649,341.52

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

		ප්‍රවර්තන වර්ෂය 2023	පූර්ව වර්ෂය 2022
සටහන			
1	**දළ ලිඛිත වාරික**		
	සූර්ව නැවීගත කිරීම් ණය ඇපකර	450,000.00	5,325,354.24
	පශ්චාත් නැවීගත කිරීම් ණය ඇපකර	468,737.70	547,381.60
	අපනයන කාර්යසාධන ඇපකර	2,181,000.00	50,000.00
	ගුවන් ගමන් වියදම් සඳහා ඇපකර (ඇපකරු)	79,993,105.14	13,317,727.20
	අපනයන ගෙවීම් රක්ෂණ ඔප්සු (විකුණුම්කරුගේ අවදානම්)	328,842,648.83	416,321,340.57
		411,935,491.67	**435,561,803.61**
	උපයා නොගත් වාරිකවල (වැඩිවීම)/ අඩුවීම **1a.**	6,590,611.36	(3,662,948.02)
	දළ ඉපැයූ වාරික	**418,526,103.03**	**431,898,855.59**
1a	**උපයා නොගත් වාරික**		
	අපනයන ගෙවීම් රක්ෂණ ඔප්සුවල දළ උපයා නොගත් වාරික		
	ජනවාරි 1 දිනට ශේෂය	23,170,908.10	18,706,711.86
	වසර තුළ දී ප්‍රකාශිත වාරික	328,842,648.83	416,321,340.57
	වසර තුළ දී උපයාගත් වාරික	337,734,106.47	411,857,144.33
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**14,279,450.46**	**23,170,908.10**
	ණය ඇපකරවල දළ උපයා නොගත් වාරික		
	ජනවාරි 1 දිනට ශේෂය	495,820.20	1,297,068.42
	වසර තුළ දී ප්‍රකාශිත වාරික	83,092,842.84	19,240,463.04
	වසර තුළ දී උපයාගත් වාරික	80,791,996.56	20,041,711.26
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,796,666.48**	**495,820.20**
	දෙසැම්බර් 31 දිනට මුළු සංචිත	17,076,116.94	23,666,728.30
	ජනවාරි 1 දිනට මුළු සංචිත	23,666,728.30	20,003,780.28
	උපයා නොගත් වාරික සංචිතයේ ශුද්ධ වෙනස	**(6,590,611.36)**	**3,662,948.02**
2	**අනෙකුත් මෙහෙයුම් ආදායම්**		
	ඇපකර, ඔප්සු, පරිපාලන, සැකසුම් හා BLL ගාස්තු	15,147,115.00	11,909,785.00
	BizInfo ආදායම	104,680.61	-
		15,251,795.61	**11,909,785.00**
3	**ආයෝජන ආදායම**		
	භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර	28,045,523.55	16,641,860.14
	ඒක්ෂණ තැන්පතු	489,268.11	14,454,884.86
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතු	22,838.62	18,558.38
	ස්ථාවර තැන්පතු (එක්සත් ජනපද ඩොලර්)	267,416,944.68	168,310,483.25
	ඉතුරුම් (එක්සත් ජනපද ඩොලර්)	531,397.83	59,614.55
	ස්ථාවර තැන්පතු (යුරෝ)	7,476,874.89	3,499,239.15
	ලාභාංශ	-	240,000.00
	ස්ථාවර තැන්පතු (රුපියල්)	480,500,950.81	324,414,633.62
	ආයෝජන අරමුදල් මත පොලිය	1,492,150.68	36,582.25
	කාර්ය මණ්ඩල ණය මත පොලිය	62,911.23	118,234.43
	පාරිතෝෂික අරමුදල් මත භාණ්ඩාගාර බිල්පත් පොලිය	1,067,711.70	1,602,241.61
	පාරිතෝෂික ඉතිරුම් ගිණුම් මත පොලිය	-	4,242.28
	විවිධ ආදායම්	4,034.69	-
		787,110,606.79	**529,400,574.52**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
(සියලුම විට්හාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	ප්‍රවර්තන වර්ෂය **2023**	පූර්ව වර්ෂය **2022**

සටහන

4 ගෙවන ලද ශුද්ධ හිමිකම්

වර්ෂය අවසානයේ දී හිමිකම් සඳහා වෙන් කිරීම් - නිශ්චිත	452,510,347.07	430,581,176.42
පසුගිය වර්ෂවල දී ලබාදුන් හිමිකම්	391,976,133.00	393,389,307.63
වර්ෂය තුළ දී හිමිකම්	**60,534,214.07**	**37,191,868.79**
අඩුකළා: පෙර වර්ෂයේ සිදුකරන පද අතිරික්ත වෙන් කිරීම්	(2,297,532.89)	-
වර්ෂය සඳහා ශුද්ධ හිමිකම් - නිශ්චිත	**62,831,746.96**	**37,191,868.79**
අවිනිශ්චිත ප්‍රතිපාදන - 2023 (සටහන් අංක 18 බලන්න)	103,780,022.24	29,021,060.58
	166,611,769.20	**66,212,929.37**

5 ආයතනික වියදම්

වරිපනම්		990,990.00	762,300.00
ජල බිල්පත්		177,392.79	102,712.73
විදුලිය		859,908.55	620,656.20
දුරකතන		570,922.34	735,431.09
ඊ-මේල් හා අන්තර්ජාල, වෙබ් අඩවිය		452,811.32	740,553.32
ආරක්ෂක සේවා		671,180.28	638,059.55
ක්ෂය කිරීම් -	ගොඩනැගිලි	8,825,000.00	8,825,000.00
	මෝටර් වාහන	4,332,000.00	4,332,000.00
	කාර්යාල උපකරණ	145,046.07	169,109.40
	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	2,604,978.06	61,559.00
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම්	231,249.35	140,925.98
	මෘදුකාංග	207,856.25	56,005.71
රක්ෂණය -	ගොඩනැගිල්ල - කාර්යාල පරිශ්‍රය (නවම් මාවත)	217,568.74	21,791.90
	මෝටර් වාහන	242,238.12	234,242.01
	කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්	27,666.19	2,731.60
අලුත්වැඩියා සහ නඩත්තු -	ගොඩනැගිලි	1,195,059.53	1,107,114.94
	මෝටර් වාහන	1,248,584.00	1,056,869.00
	කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ	473,012.15	135,678.28
	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	629,183.78	334,776.00
	මෘදුකාංග	1,002,272.35	535,579.33
		25,104,919.87	**20,613,096.04**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
(සියලුම විට්පාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	ප්‍රවර්තන වර්ෂය 2023	පූර්ව වර්ෂය 2022
සටහන		
6 පරිපාලන වියදම්		
වැටුප් හා දීමනා	23,171,743.81	20,895,566.78
අනෙකුත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	18,230,029.82	16,092,403.45
බඳවා ගැනීම්, දේශීය සුහුඹු හා අධ්‍යාපන ආයතන සඳහා දායකත්ව මුදල්	1,765,047.51	4,450.00
තේ පැන් හා ආශ්‍රිත වියදම්	1,001,906.35	565,766.12
සේවක අර්ථසාධක අරමුදල	4,897,171.72	5,130,783.51
සේවක භාරකාර අරමුදල	667,039.42	641,348.05
පාරිතෝෂික	2,401,583.33	18,525,745.00
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු	390,000.00	230,000.00
ගමන් වියදම්, ප්‍රවාහන හා යැපීම්	408,822.81	225,460.00
තැපැල් ගාස්තු	66,219.48	8,660.00
වාර්ෂික වාර්තාව හා අනෙකුත් මුද්‍රණ කටයුතු	455,100.00	1,414,687.00
කාර්ය මණ්ඩල ණය කපා හැරීම්	111,115.44	-
ලිපිද්‍රව්‍ය	1,337,437.21	140,965.00
ඉන්ධන	993,223.56	1,822,172.50
බාහිර විගණන ගාස්තු	1,295,000.00	1,310,000.00
Cloud Backup ගාස්තු සහ වෙබ් අඩවිය හා විද්‍යුත් තැපැල් ආදිය පවත්වාගෙන යෑ	682,815.95	-
අභ්‍යන්තර විගණන ගාස්තු	-	688,160.00
වෘත්තීය, තාක්ෂණික සහ උපදේශක ගාස්තු	1,068,453.79	278,770.25
පොදු වියදම්	236,693.75	167,610.45
මුද්දර ගාස්තු	23,490.00	19,300.00
ප්‍රවෘත්ති පත්‍ර, පොත් සහ සඟරා	-	6,520.00
සංවත්සර කටයුතු වියදම්	720,544.00	700,000.00
සේවක ආරක්ෂාව වෙනුවෙන් වියදම් (කොවිඩ්)	-	160,240.00
වාර්ෂික වාරිකාව	854,766.80	-
ජීවිත රක්ෂණ	251,372.74	-
	61,029,577.49	**69,028,608.11**
7 විකුණුම් හා අලෙවිකරණ වියදම්		
ප්‍රවර්ධන සහ ව්‍යාපාර සංවර්ධන වියදම්	1,129,211.67	-
වෙළඳ ප්‍රචාරණය	1,356,535.00	-
මුද්‍රණ වියදම් - ප්‍රචාරක ප්‍රකිකා, ෆෝර්ම, අයදුම්පත් ආදිය සඳහා	86,940.00	-
භාෂා පරිවර්තන ගාස්තු	59,075.00	143,640.00
ඉන්ධන වියදම්	189,185.44	334,612.50
ආයතනික සාමාජිකත්වයන්	241,530.00	198,705.00
අන්තර්ජාතික වෘත්තීය සහ අපනයන ආශ්‍රිත සංවිධාන සඳහා දායකත්ව මුදල්	5,782,400.00	3,807,125.22
අනුග්‍රාහකත්වයන්	835,000.00	-
	9,679,877.11	**4,484,082.72**
8 මූල්‍ය ගාස්තු		
බැංකු ගාස්තු	168,133.56	117,636.78
මුද්දර බදු	28,710.00	23,750.00
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	-	9,611,459.80
එකතු කළ අගය මත බද්ද	-	217,313.00
	196,843.56	**9,970,159.58**

8a මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද

අදාළ පනතේ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය සේවා මත එකතු කළ බද්ද මෙම සංස්ථාවට අදාළ නොවේ.

8b ආදායම් බදු

2018 අප්‍රේල් 01 වන දින සිට බලාත්මක වූ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ නව සංශෝධනය හා ඉන් අනතුරුව පැමිණි සංශෝධන ප්‍රකාරව, සංස්ථාවේ මුළු ආදායම් ආදායම් බද්දට යටත් වන අතර ඒට පෙර එහි ආයෝජන ආදායම් පමණක් ආදායම් බද්දට යටත් විණි.
2018ට පෙර සංස්ථාව විසින් 28%ක අනුපාතිකයක් යටතේ ආදායම් බදු ගෙවූ නමුදු, නව සංශෝධන සමඟ සංස්ථාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් ලෙස වර්ගීකරණය කර ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 14%ක අඩු අනුපාතිකයකට බදු ගෙවනු ලැබේ.
එසේ වුව ද, 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව, 2022/23 වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද වනුයේ ගණනය කළ යුතු කාල සීමා දෙකකට වෙන් වෙන්ව වශයෙන් තක්සේරු කරනු ලබන දළ ලාභ මත හෝ සම්මානුපාතික පදනම්හි 75:25 අනුපාතිකයට පිළිවෙලින් මාස 09 හා මාස 03ක කාලසීමාවන් සඳහා ය. එනිසා, 2022/23 වර්ෂයේ 4 වන කාර්තුව සඳහා සංස්ථාපිත ආදායම් බද්ද 30%ක අනුපාතිකයකින් අදාළ වේ.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
(සියලුම විට්හාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

		ප්‍රවර්තන වර්ෂය 2023	පූර්ව වර්ෂය 2022

9 දේපළ, පිරියක සහ උපකරණ

9.1 දළ ධාරණ අගය	2023 ජනවාරි 01 දිනට පිරිවැය	එකතු කිරීම්/පැවරීම්	(ඉවත්කිරීම්)/පැවරීම්	2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය
ගොඩනැගිලි	176,500,000.00	-	-	**176,500,000.00**
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,409,261.00	912,733.75	-	**2,321,994.75**
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	5,464,452.33	10,419,912.24	-	**15,884,364.57**
කාර්යාල උපකරණ	1,388,008.58	443,234.00	-	**1,831,242.58**
මෝටර් වාහන	21,660,000.00	-	-	**21,660,000.00**
	206,421,721.91	**11,775,879.99**	-	**218,197,601.90**

9.2 ක්ෂය කිරීම්	2023 ජනවාරි 01 දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම් / පැවරීම්	ඉවත් කිරීම්/වැරදි නිවැරදි කිරීම්/පැවරීම්	2023 දෙසැම්බර් 31 දිනට ශේෂය
ගොඩනැගිලි	44,125,000.00	8,825,000.00		**52,950,000.00**
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	842,111.51	231,249.35		**1,073,360.86**
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	5,464,452.33	2,604,978.06		**8,069,430.39**
කාර්යාල උපකරණ	1,306,253.01	145,046.07		**1,451,299.08**
මෝටර් වාහන	4,332,000.00	4,332,000.00		**8,664,000.00**
	56,069,816.85	**16,138,273.48**	-	**72,208,090.33**
ශුද්ධ විට්හාකම	**150,351,905.06**			**145,989,511.57**
සටහන - 9-අ අක්ෂෘෂ්‍ය වත්කම්				
මෘදුකාංග	7,504,374.77	-	-	**7,504,374.77**
	7,504,374.77	-	-	**7,504,374.77**
සුමක්ෂය				
මෘදුකාංග	6,728,943.48	207,856.25	-	**6,936,799.73**
	6,728,943.48	**207,856.25**	-	**6,936,799.73**
ශුද්ධ විට්හාකම	**775,431.29**			**567,575.04**
මුළු දේපළ, පිරියක සහ උපකරණ	**151,127,336.35**			**146,557,086.61**

10 දිගු කාලීන ආයෝජන

ඉන්ග්‍රින් සමාගමේ කොටස්	10.00	10.00
ණය තොරතුරු කාර්යාංශයේ කොටස්	123,700.00	123,700.00
භාණ්ඩාගාර බැඳුම්කර	8,089,500.00	8,086,709.12
රුපියල්වලින් පවතින ස්ථාවර තැන්පතු	376,253,657.81	-
	384,466,867.81	**8,210,419.12**

11 විවිධ ණයගැතියෝ, තැන්පතු හා පූර්ව ගෙවීම්

අපනයන බිල්පත් වට්ටම් කිරීමේ පහසුකම් මත අත්තිකාරම්	34,958,636.11	34,958,636.11
අඩුකළා: අඩමාණ ණය සඳහා වෙන් කිරීම්	(34,958,636.11)	(34,958,636.11)
	-	-
කාර්ය මණ්ඩල ණය හා පොදු අත්තිකාරම්	2,671,468.28	2,247,114.91
විවිධ තැන්පතු	108,837.50	108,837.50
නැවත ආපසු ලබාදෙන තැන්පතු	406,500.00	131,500.00
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සුභසාධන සංගමය වෙත ලබාදුන් ණය	500,000.00	-
වැට්ස් සහ දීමනා පාලන ගිණුම්	30,935.25	-
විවිධ ණයගැතියෝ	770.00	770.00
පූර්ව ගෙවීම්	563,996.27	747,371.50
BizInfo ලැබිය යුතු ආදායම්	(6,430.80)	368,346.82
නැවත ආපසු ලබාගත හැකි මූල්‍ය සේවා මත වැටී බද්ද	2,185,511.00	2,185,511.00
නැවත ආපසු ලබාගත හැකි රඳවා ගැනීමේ බද්ද	27,586,095.84	-
	34,047,683.34	**6,441,401.78**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
(සියලුම විට්හාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)

Note		ප්‍රවර්තන වර්ෂය 2023	පූර්ව වර්ෂය 2022
16	**ගෙවිය යුතු සාරිතෝෂික**		
	ඉදිරියට ගෙනා ශේෂය	30,010,488.00	14,328,995.00
	වර්ෂය සඳහා සාරිතෝෂික වෙන් කිරීම්	2,401,583.33	18,525,745.00
	ඌනතා/අධි වෙන්කිරීම්	(16,376,815.93)	-
		16,035,255.40	32,854,740.00
	වර්ෂය තුළ ගෙවීම්	(2,568,771.00)	(2,844,252.00)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**13,466,484.40**	**30,010,488.00**
17	**විවිධ ණය බිම්යෝ, උපචිත වියදම් හා ප්‍රතිසාදන වෙන් කිරීම**		
	විවිධ ණය බිම්යෝ		
	සාමාන්‍ය වැටී බද්ද (ඔස්සු වාරිකයෙන් අයකරන ලද)	1,906,902.00	2,538,291.00
	කාර්ය මණ්ඩල වෛද්‍ය අරමුදල	724,038.00	667,618.00
	පාරිභෝගිකයන්ගෙන් රඳවාගන්නා ආපසු ගෙවනු ලබන තැන්පතු	2,025,300.00	1,572,500.00
	උපචිත වියදම්		
	සේවක අර්ථසාධක අරමුදල	(309,861.96)	907256.25
	සේවක භාරකාර අරමුදල	32,783.51	75604.71
	ලුද්දර ගාස්තු	6,925.00	11275.00
	අනෙකුත් ගෙවිය යුතු	21,739,550.66	12924730.89
	තත්ත්ව වාර්තා සඳහා ගාස්තු	-	1032733.11
	උපචිත	8,621,280.00	-
	ප්‍රතිසාදන වෙන් කිරීම		
	ගෙවිය යුතු විගණන ගාස්තු	1,287,118.00	1,506,480.00
	ගෙවිය යුතු ආදායම් බදු	267,576,715.48	150,622,225.52
	මූල්‍ය සේවා මත වැටී බද්ද	48,193,771.16	56,052,197.31
	වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමේ ගාස්තු	1,485,540.00	1,488,290.00
	ගෙවිය යුතු සම්පේ ආරක්ෂණ දායකත්ව බද්ද	8,325,754.55	8,325,754.55
	ගෙවිය යුතු අත්තිකාරම් සුද්ගල ආදායම් බද්ද	131,761.93	-
	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සුභසාධන සංගමය	5,150.00	-
	භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බද්ද	300,000,000.00	-
		661,752,728.33	**237,724,956.34**
18	**ඉදිරියේ දී ගෙවිය යුතු බිම්කම්සඳහා වෙන්කිරීම**		
	ජනවාරි 1 දිනට ශේෂය	454,601,351.49	469,648,335.00
	වර්ෂය තුළ ගෙවූ බිම්කම්	(40,574,275.29)	(2,791,467.79)
	බිම්කම් සඳහා අවිනිශ්චිත වෙන් කිරීම්	414,027,076.20	466,856,867.21
	වර්ෂය සඳහා වෙන්කිරීම්	103,780,022.24	29,021,060.58
	දෙසැම්බර් 31 වැනි දිනට ඉතිරි ප්‍රතිසාදන	**517,807,098.44**	**495,877,927.79**
	බිම්කම් සඳහා වෙන්කළ මුළු ප්‍රතිසාදනය	**517,807,098.44**	**495,877,927.79**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
(සියලුම විට්හාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

සටහන		ප්‍රවර්තන වර්ෂය 2023	පූර්ව වර්ෂය 2022
16	**ගෙවිය යුතු පාරිතෝෂික**		
	ඉදිරියට ගෙනා ශේෂය	30,010,488.00	14,328,995.00
	වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම්	2,401,583.33	18,525,745.00
	ඌනතා/අධි වෙන්කිරීම්	(16,376,815.93)	-
		16,035,255.40	32,854,740.00
	වර්ෂය තුළ ගෙවීම්	(2,568,771.00)	(2,844,252.00)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**13,466,484.40**	**30,010,488.00**
17	**විවිධ ණය හිමියෝ, උපචිත වියදම් හා ප්‍රතිසාදන වෙන් කිරීම**		
	විවිධ ණය හිමියෝ		
	සංමාන්‍ය වැටී බද්ද (ඔප්පු වාරිකයෙන් අයකරන ලද)	1,906,902.00	2,538,291.00
	කාර්ය මණ්ඩල වෛද්‍ය අරමුදල	724,038.00	667,618.00
	පාරිභෝගිකයන්ගෙන් රඳවාගන්නා ආපසු ගෙවනු ලබන තැන්පතු	2,025,300.00	1,572,500.00
	උපචිත වියදම්		
	සේවක අර්ථසාධක අරමුදල	(309,861.96)	907256.25
	සේවක භාරකාර අරමුදල	32,783.51	75604.71
	මුද්දර ගාස්තු	6,925.00	11275.00
	අනෙකුත් ගෙවිය යුතු	21,739,550.66	12924730.89
	තත්ත්ව වාර්තා සඳහා ගාස්තු	-	1032733.11
	උපචිත	8,621,280.00	-
	ප්‍රතිසාදන වෙන් කිරීම		
	ගෙවිය යුතු විගණන ගාස්තු	1,287,118.00	1,506,480.00
	ගෙවිය යුතු ආදායම් බදු	267,576,715.48	150,622,225.52
	මූල්‍ය සේවා මත වැටී බද්ද	48,193,771.16	56,052,197.31
	වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමේ ගාස්තු	1,485,540.00	1,488,290.00
	ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	8,325,754.55	8,325,754.55
	ගෙවිය යුතු අත්තිකාරම් සුද්ගල ආදායම් බද්ද	131,761.93	-
	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සුභසාධන සංගමය	5,150.00	-
	භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බද්ද	300,000,000.00	-
		661,752,728.33	**237,724,956.34**
18	**ඉදිරියේ දී ගෙවිය යුතු හිමිකම්සඳහා වෙන්කිරීම්**		
	ජනවාරි 1 දිනට ශේෂය	454,601,351.49	469,648,335.00
	වර්ෂය තුළ ගෙවූ හිමිකම්	(40,574,275.29)	(2,791,467.79)
	හිමිකම් සඳහා අවිනිශ්චිත වෙන් කිරීම්	414,027,076.20	466,856,867.21
	වර්ෂය සඳහා වෙන්කිරීම්	103,780,022.24	29,021,060.58
	දෙසැම්බර් 31 වැනි දිනට ඉතිරි ප්‍රතිපාදන	**517,807,098.44**	**495,877,927.79**
	හිමිකම් සඳහා වෙන්කළ මුළු ප්‍රතිපාදනය	**517,807,098.44**	**495,877,927.79**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
(සියලුම විවිධාකාරී ශ්‍රී ලංකා රුපියල් වලින්)

සටහන

19 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ අනාවරණය කිරීම්

- ප්‍රත්‍යාගණනය බලාත්මක වන දිනය

ගොඩනැගිලි	2018 ජනවාරි 01
මෝටර් වාහන	2021 දෙසැම්බර් 31
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	2016 දෙසැම්බර් 31
කාර්යාල උපකරණ	2016 දෙසැම්බර් 31
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	2016 දෙසැම්බර් 31

- තක්සේරු කිරීම් සිදුකරන ලද්දේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසිනි.
- පරීක්ෂා කිරීමෙන් හා නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව විවිධාකාම කෙරෙහි බලපෑම අදාළ සියලුම සාධක සැලකිල්ලට ගෙන හැකිතාක් නිරවද්‍ය ආකාරයට තක්සේරුව සිදුකර තිබේ.
- ප්‍රත්‍යාගණනය මගින් පැමිණි අගය විනාශ වත්කම්වල වෙළඳපොළ විවිධාකම යි.
- පිරිවැය ආකෘතිය යටතේ ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ධාරණය අගය සැලකේ.

ගොඩනැගිලි	132,375,000.00
මෝටර් වාහන	17,328,000.00
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	-
කාර්යාල උපකරණ	-
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	567,148.24
මේඛ්කාංග	775,431.29

20 අවිනිශ්චිත වගකීම්

(අ) සංස්ථාවට එරෙහිව ගොනුකර ඇති නඩු

1 ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට එරෙහිව සදර්න් සන් ට්‍රේ (ප්‍රයිවට්) ලිමිටඩ්; HC (CIVIL) 193 2004 (I)
රු.මිලියන 17.02 ක විවිධාකම්කින් යුතු හිමිකමක් ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අපනයනකරුවෙකු විසින් කොළඹ වාණිජ් මහාධිකරණයේ දී මෙම නඩුව ගොනු කරන ලදී.
වර්තමාන තත්ත්වය: අපනයනකරුට වාසිදායක ආකාරයෙන් නඩු තීන්දුව ප්‍රකාශයට පත්කර ඇති අතර, නඩුව සම්බන්ධයෙන් අභියාචනයක් ගොනු කළ අතර අභියාචනාධිකරණයේ තීන්දුව ප්‍රකාශයට පත්කළ යුතු ව ඇත.

2 ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට එරෙහිව ට්‍රොපිකල් ඔෂධ (ප්‍රයිවට්) ලිමිටඩ්; CHC 47/2020/MR
මෙම නඩුව පවරා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ සූරියා එල්එල්සී වෙත ගෙවීමක කොටසක් සිදුකර තිබීමෙන් වන අතර රු.මිලියන 27.5 ක හිමිකමක් ඉල්ලා ඇත.

(ආ) 2023 දෙසැම්බර් 31 වන දිනට සංස්ථාව විසින් දරන ලද වගකීම්

- වලංගුව පවතින අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු
- වලංගුව පවතින ණය ඇපකර
- උපරිම වගකීම්

21 ආයෝජන අරමුදල් ගිණුම

භාණ්ඩාගාර නියෝගයක් මත වාර්ෂික පදනමින් මූල්‍ය සේවා මත බදු බද්දෙන් 8%කට හා ආදායම් බද්දෙන් 5%කට වශයෙන් වූ මුළු මුදලක් මාරු කිරීම සඳහා 2011 නොවැම්බර් මස ආයෝජන අරමුදල් ගිණුම විවෘත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව, සංස්ථාව විසින් අරමුදල් ණය වශයෙන් ලබා නොදෙන බැවින්, ආයෝජන අරමුදලේ අරමුදල් වසර 7ක කාල සීමාවක් මුළුල්ලේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබේ. සංස්ථාව විසින් රු. 8.809ක ප්‍රකාශිත අගයක් සහිත රු.මී. 8.086ක් වසර 7කට වැඩි කාල සීමාවක භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇති අතර මෙම ආයෝජන දීර්ඝ කාලීන ආයෝජන ලෙස ලැයිස්තු ගත කර ඇත.

22 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

නම	තනතුර	ආශ්‍රිත පාර්ශව ගනුදෙනුවේ ස්වභාවය	ලිපිනය
එස්.සී.ඒ.දේවේන්ද්‍ර මයා	සභාපති	නොමැත	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව,# 42, 4 වැනි මහල, NDB-EDB කුළුණ,කොළඹ 02
ඒ.ඒ.අයි.දිල්රුක්ෂි මෙය	විධායක නොවන අධ්‍යක්ෂක	නොමැත	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ලේකම් කාර්යාලය, කොළඹ 01
ඒ.ඒ.එම්.නසීම් මයා	විධායක නොවන අධ්‍යක්ෂක	නොමැත	ශ්‍රී ලංකා මහ බැංකුව, නො.30, ජනාධිපති මාවත, කොළඹ 01
ප්‍රියන්ත පෙරේරා මයා	විධායක නොවන අධ්‍යක්ෂක	නොමැත	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, නො.21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
බී.එම්.එස්.බණ්ඩාර මෙය	විධායක නොවන අධ්‍යක්ෂක	නොමැත	වෙළඳ අමාත්‍යාංශය, LHP ගොඩනැගිල්ල, 492, ආර්.ඒ ද මෙල් මාවත, කොළඹ 03

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC)

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදු තොරතුරු

1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ස්ථාපනය කර ඇති අතර, 1979 පෙබරවාරි 08 වැනි දින සිට වාණිජ මෙහෙයුම් ආරම්භ කර තිබේ.
සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, නවම් මාවතේ, අංක 42 දරන ස්ථානයේ NDB-EDB කුළුනෙහි 4 වැනි මහලේ පිහිටා තිබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

1. පිළියෙළ කිරීමේ පදනම

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වාණිජ සහ දේශපාලනික හේතූන් මත විදේශීය ගැනුම්කරුවන් විසින් අපනයන සඳහා නොගෙවීමේ අවදානම ආවරණය කරමින් අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම සහ අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන ව්‍යාපාරවල අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා ලිහිල් සීමා යටතේ මුදල් ලබාදීමට පහසුකම් සැලසීම සඳහා බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට ඇපකර නිකුත් කිරීම ඔස්සේ අපනයන වෙළඳාමේ අවදානම දැරීම සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ..

1.2 මිනුම්කරණ පදනම

2023 දෙසැම්බර් 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමඟ ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබේ. ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශ සඳහා බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් කිරීමකින් තොරව අඛණ්ඩව යොදා ගෙන තිබේ.

1.3 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (LKAS) අනුකූල වන අතර ඒ සඳහා ප්‍රතිපත්ති යොදාගැනීම සහ වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තාගත අගයන් මත බලපාන තීන්දු ගැනීම, ඇස්තමේන්තු කිරීම් හා උපකල්පනයන් කළමනාකාරිත්වය විසින් සිදුකළ යුත්තේ ය. අවස්ථානුගතව සාධාරණයැයි හැඟෙන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන පදනම් වන අතර, වෙනත් මූලාශ්‍රවලින් පහසුවෙන් දෘශ්‍යමාන නොවන වත්කම් සහ වගකීම්වල ධාරණ අගය නිශ්චය කිරීම සඳහා පදනමක් එමඟින් සැපයේ. ඇස්තමේන්තු සහ ඊට පාදක උපකල්පන කෙරෙහි යන පදනමින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන, අදාළ සංශෝධනය එය සිදුකරන කාලසීමාවට පමණක් බලපානු ලබන්නේ නම් එම කාල සීමාව තුළ හඳුනා ගැනීම හෝ අදාළ සංශෝධනය ප්‍රවර්තන හා අනාගත කාල සීමා දෙකම සඳහා බලපානු ලබන්නේ නම්, අදාළ සංශෝධනය එම කාල සීමාව සහ අනාගත කාල සීමා සඳහා හඳුනාගැනීම සිදුකෙරේ.

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, නුදුරු අනාගතයේ දී අඛණ්ඩව පැවතීම සම්බන්ධයෙන් ආයතනයේ හැකියාව සම්බන්ධයෙන් තක්සේරුවක් සිදුකරනු ලැබේ. අනාගතය සම්බන්ධයෙන් ලබාගත හැකි සියලු තොරතුරු සැලකිල්ලට ගැනීමේ දී ආයතනය ඇවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීම සඳහා අවශ්‍යතාවයක් අප විසින් දකිනු නොලැබේ.

2. සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුරූපී ආකාරයෙන් යොදාගන්නා අතර පෙර වර්ෂයේ දී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුරූප වේ.

3.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරෙන සියලුම කාල පරිච්ඡේද සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුරූපී ආකාරයෙන් යොදා ගෙන ඇති අතර, සංස්ථාව විසින් අනුරූපී ආකාරයෙන් යොදා ගනු ලැබේ..

3.1 විදේශ ව්‍යවහාර මුදල් ඒකක වලින් සිදුකරන ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අයිතම ශ්‍රී ලංකා රුපියල්වලින් (LKR) මිනුකරණය කර තිබේ. විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් සිදුකරන ගනුදෙනු එකී ගනුදෙනු සිදුවෙන දිනවල පවත්නා විනිමය අනුපාතික භාවිතා කරමින් වාර්තාකරණ මුදල් ඒකකයට පරිවර්තනය කර තිබේ. එවැනි ගනුදෙනු පියවීමේ දී ප්‍රතිඵල වන්නා වූ විදේශ විනිමය අනුපාතික ලැබීම්/ පාඩු ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ. ශේෂ පත්‍ර දිනයට විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් නාමනය වන්නා වූ මුදල් වත්කම් සහ වගකීම්, එකී දිනයේ දී පවතින විනිමය අනුපාතික ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් නාමනය වන්නා වූ මුදල් වත්කම් සහ වගකීම් පරිවර්තනය කිරීමේ දී ප්‍රතිඵල වන්නා වූ විදේශ විනිමය අනුපාතික ලැබීම්/ පාඩු, ගිණුම්කරණ ප්‍රමිත LKAS 21 අනුකූලව 2018 මූල්‍ය වර්ෂයේ සිට ඛලාත්මක වන පරිදි ලාභ සහ පාඩු ගිණුමේ හඳුනාගනී.

2018 වර්ෂයට පූර්වයෙන්, වෙන්ව පැවති විදේශ ව්‍යවහාර මුදල් ඒකක සමාකරණ සංචිතයක් තුළින් ශුද්ධ විදේශ විනිමය අනුපාතික ලැබීම්/ පාඩු හඳුනාගනු ලැබූ අතර, එය 2018 වර්ෂයේ සිට බලාත්මකවීම අවසන්කරන ලදී.

3.2 දේපළ, පිරියත සහ උපකරණ

අ) හඳුනාගැනීම සහ මිනුම්කරණය

දේපළ, පිරියත සහ උපකරණවල සමුච්චිත ක්ෂයකිරීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර පිරිවැය/ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම මත සටහන් කෙරේ. මෙම පිරිවැයට වත්කම අත්පත් කරගැනීම සඳහා සෘජුවම අදාළ කරගත යුතු වියදම් ඇතුළත් වේ. ස්වයං- නිර්මිත වත්කම්වල පිරිවැයට එය සෑදීම සඳහා යොදාගත් ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වන ක්‍රියාකාරී තත්ත්වයට රැගෙන ඒම සඳහා සෘජුවම අදාළ වන වෙනත් පිරිවැය, සහ එම අයිතම කොටස්වලට වෙන්කර ඉවත් කිරීම සහ ඒවා ස්ථානගත කළ ස්ථානය යථා තත්ත්වයට පත්කිරීමේ පිරිවැය ද ඇතුළත් වේ. යම් දේපළක්, පිරියතක් සහ උපකරණයක් වෙනස් ආයු කාල සහිත ප්‍රධාන සංරචකවලින් සමන්විත වේ නම්, ඒවා වෙන් වෙන් දේපළ, පිරියත සහ උපකරණ අයිතම ලෙස ගිණුම්ගත කෙරේ.

දේපළ, පිරියත සහ උපකරණ අයිතම බැහැර කිරීමෙන් ලබන ලාභ හෝ පාඩු නිර්ණය කරනුයේ බැහැර කිරීමෙන් ලබන ආදායම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර, එය ආදායම් ප්‍රකාශයේ "ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාගනී.

ආ) ක්ෂය කිරීම

සින්නක්කර ඉඩම් හැරුන විට සියලුම දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මුළුල්ලේ ඒවායෙහි ශේෂ අගයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පැවරීම සඳහා සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂය කිරීම් සඳහා වෙන් කිරීම් ගණනය කෙරේ. මිලදී ගනු ලබන වර්ෂයේ දී පූර්ණ වශයෙන් ක්ෂය කරනු ලබන අතර ඉවත් කරන වර්ෂයේ දී ක්ෂය කිරීම් ගණනය කරනු නොලැබේ.

වාර්ෂික ක්ෂය කිරීම් අනුපාතික පහත පරිදි වේ.

1. ගොඩනැගිලි	5%	වසර 20
2. කාර්යාලීය උපකරණ	25%	වසර 04
3. මෝටර් වාහන	20%	වසර 05
4. පරිගණක මෘදුකාංග සහ පරිගණක	25%	වසර 04
5. ලීබඩු සහ සවිකරීම්	10%	වසර 10

මෙම වත්කම්වලට අදාළව නාමික ඓතිහාසික පිරිවැය ක්ෂය යටතේ ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත අය කෙරෙන වාර්ෂික ක්ෂය කිරීමහි අතිරික්තයට සමාන වන වටිනාකමක් වර්ෂිකව ප්‍රත්‍යාගණනිත අතිරික්තයේ සිට උපචිත පොළිය වෙත මාරු කෙරේ. වත්කමෙහි ධාරණ අගය, එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩිවිට එහි අයකර ගතහැකි වටිනාකම දක්වා වහාම ලියා හරිනු ලැබේ.

ඇ) බැහැර කිරීම්

බැහැර කිරීමහි ලාභ සහ පාඩු එයින් ලැබූ ආදායම ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමෙන් නිර්ණය කරන අතර, ආදායම් ප්‍රකාශයේ මෙහෙයුම් ලාභය හෝ පාඩුව නිර්ණය කිරීමේ දී හඳුනාගනී. ප්‍රත්‍යාගණනිත වත්කම් අලෙවි කිරීමේ දී, ප්‍රත්‍යාගණනිත සංචිතයේ ඇතුළත් අගය රඳවාගත් ඉපැයුම් වෙත මාරු කෙරේ.

ඈ) හානිකරණය

හානිකරණය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය වාර්ෂිකව හෝ ධාරණ අගය අය කරගත නොහැකි බව සිද්ධි හෝ අවස්ථාවන්ගේ වෙනස්වීම මඟින් හැඟවෙන විට සමාලෝචනය කෙරේ. එවැනි හැඟවීමක් පවතින විට සහ ධාරණ අගය ඇස්තමේන්තුගත අයකරගත හැකි අගය ඉක්මවා යනවිට දී, වත්කම් ඒවායේ අය කරගත හැකි අගයට ලියා හරිනු ලැබේ. යම්කිසි වත්කමක් පූර්ව ප්‍රත්‍යාගණනිත අතිරික්තය ප්‍රතිවර්තනය නොමැති නම් හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

ඉ) දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලාභ/ පාඩු

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ සහ ඉවත් කිරීමේ ලාභ හෝ පාඩු එම අලෙවිය සිදුකළ කාල සීමාවට අදාළව හඳුනාගන්නා අතර වෙනත් ආදායම් යටතේ වර්ගීකරණය කෙරේ.

3.3 කෙරී ගෙන යමින් පවතින ප්‍රාග්ධන කාර්යය

ශේෂපත්‍ර දිනයට සම්පූර්ණ කර නොමැති වර්ෂය තුළ වැය දරන ලද ප්‍රාග්ධන වියදම්, පුර්ව ගෙවීම් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ නිමාකර භාවිතයට යොදා ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත සහ උපකරණ යටතට මාරු කෙරේ.

3.4 අස්පෘශ්‍ය වත්කම්

සංස්ථාව විසින් අත්පත් කරගනු ලැබූ සැලකිය යුතු ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්හි අගය එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකර මිනුම්කරණය කෙරේ. පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම ආශ්‍රිත පිරිවැය එය වැය කරන අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගැනේ. සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන සහ පාලනය කරන හඳුනාගත හැකි සහ සුවිශේෂී මෘදුකාංග නිෂ්පාදන සකස් කිරීම සහ පරීක්ෂා කිරීම් සඳහා සෘජුවම වැයවන සංවර්ධන පිරිවැය ද අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ.

අ) හඳුනාගැනීමේ පදනම

අස්තිත්වය තුළට අනාගත ආර්ථික ප්‍රතිලාභයන් වත්කම තුළින් ගලා ඒම පිළිබඳව අපේක්ෂා කළ හැකිනම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක වත්කම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගන්නා අතර සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු පිරිවැයෙන් අඩුකර වාර්තා කෙරේ.

ආ) පසුකාලීන වියදම්

පසුකාලීන වියදම් හඳුනාගනු ලබන්නේ එම නිශ්චිත වත්කම් හා බැඳුනු අනාගත ප්‍රතිලාභයන් එමඟින් වැඩිවේ නම් පමණි. අභ්‍යන්තරිකව බැඳුන කීර්තිනාමය සහ සන්නාම ඇතුළු අනෙකුත් සියලු වියදම්, වැය දරන අවස්ථාවේ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

ඇ) භාවිතයෙන් ඉවත් කිරීම සහ බැහැර කිරීම

අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීම හෝ එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට සහ පසුව සිදුවන බැහැර කිරීමේ අවස්ථාවේ දී ඒවා හඳුනා ගැනීම අත්හරිනු ලැබේ.

ඈ) ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය තුළ දී භාවිතය සඳහා ගතහැකි දිනයේ සිට සරල රේඛීය පදනමින් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

ඉ) හානිකරණය

ස්පෘශ්‍ය වත්කම්වලට හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට ඇඟවීමක් තිබේ ද යන්න නිර්ණය කරගැනීම සඳහා සංස්ථාව විසින් එහි වත්කම්වල ධාරණ අගය සෑම ශේෂ පත්‍ර දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් පවතී නම්, වත්කමේ නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කෙරේ. වත්කමක ධාරණ අගය හෝ එහි මුදල් උත්පාදන ඒකකය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවා යන සෑම අවස්ථාවකදීම හානිකරණ පාඩුව හඳුනාගැනේ. හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

3.5 ආයෝජන දේපළ

දිගුකාලීන ඉපැයුම් හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ දෙකම සඳහා තබා ඇති දේපළ, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කෙරේ. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, ආයෝජන දේපළ පිරිවැයට පවත්නා ගෙන යයි.

3.6 කෙටිකාලීන ආයෝජන

අ) දේශීය මුදල් ඒකකවලින් පවතින කෙටි කාලීන ආයෝජන

කෙටි කාලීන අතිරික්ත අරමුදල් සංස්ථාව විසින් රජයේ භාණ්ඩාගාර බිල්පත්වල හෝ අනෙකුත් ස්ථීර ආදායම් ආයෝජනවල ආයෝජනය කරන අතර, ශේෂ පත්‍ර දිනයට පවතින විනිමය

අනුපාතිකය මත අගය කරන විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් නාමනය වන ස්ථිර තැන්පතු හැරුන විට ඒවා පිරිවැය මත ගිණුම්ගත කෙරේ. මෙම ආයෝජන මත උපචිත වන පොළිය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

ආ) විදේශීය මුදල් ඒකකවලින් පවතින කෙටි කාලීන ආයෝජන

විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් ලබාදිය යුතු අනාගත හිමිකම් බැඳීම් සපුරාලීම සඳහා අවශ්‍ය කරන අරමුදල් වෙන්කර තබන අතර පොලිය එකතුවන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල තැන්පත් කරනු ලැබේ. ඒ සඳහා උපචිත වන පොළිය, ගනුදෙනුව සිදුවන දිනයේ පවතින විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී. මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ආයෝජන වටිනාකම් ශේෂ පත්‍ර දිනයේ පවතින විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කෙරේ.

3.6.1 මූල්‍ය ආයෝජන: කල්පිරීම තෙක් දරා සිටින

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථිර තැන්පතු සහ ණයකරවල රුපියල්වලින් ආයෝජනය කර ඇති කෙටි කාලීන සහ දිගු කාලීන ආයෝජන කල් පිහිටීම තෙක් දරා සිටින අතර පිරිවැයට ලැබිය යුතු පොලිය එකතු කර සඳහන් කෙරේ.

3.6.2 මූල්‍ය උපකරණවලින් පැන නඟින අවදානම්

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පතු සහ ණයකරවල සිදුකර ඇති ආයෝජනවලින් කෙටිකාලීන සහ දිගු කාලීන ආයෝජන සමන්විත වේ. ණයකර ඔස්සේ පොලී අනුපාතික අවදානම, ප්‍රති ආයෝජන අවදානම, පැහැර හැරීමේ අවදානම සහ ද්‍රවශීලතා අවදානම පවතී. කල් පිරීම දක්වා පවතින ස්ථාවර තැන්පතු සඳහා පැහැර හැරීමේ අවදානම සහ ද්‍රවශීලතා අවදානම පමණක් පවතින නමුදු දේශීය ව්‍යවහාර මුදල්වලින් පවතින ස්ථිර තැන්පතු සඳහා ආවේණික අවදානම් හැර විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් පවතින ස්ථාවර තැන්පතු සඳහා විනිමය අනුපාතික විචලනයන්ටද නිරාවරණය වේ. මෙම තැන්පතු රාජ්‍ය බැංකුවල පවත්වාගෙන යෑමේ වාතාවරණයක් තුළ, විදේශ විනිමය අනුපාතිකයන් විචලනය වීමේ අවදානම හැර, ඉහත සඳහන් කළ සියලුම අවදානම් අවම මට්ටමක පවතී.

3.7 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු

උපලබ්ධි විය යුතු ලෙස ඇස්තමේන්තු කරන වටිනාකමට වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ දැක්වේ. වසර තුනකට වැඩි කාල සීමාවක් මුළුල්ලේ නොගෙවා ඇති බොල් ණය සහ අඩමාන ණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීම් සිදුකර තිබේ.

3.8 තොග

ලිපිද්‍රව්‍ය තොග සහ පාරිභෝජන අයිතමවලින් තොග සමන්විත වේ. පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොගවල වටිනාකම් මිනුම්කරණය වේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී තොග විකිණිය හැකි මිල වේ.

3.9 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් වශයෙන් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යයන් සඳහා පහසුවෙන් දන්නා මුදල් වටිනාකම්වලට පරිවර්තනය කළ හැකි දෑ වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ නිර්වචනය කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් සහ ගෙවීමට ඇති බැංකු අයිරා, කෙටි කාලීන ණය ගැනුම් සහ කෙටි කාලීන ආයෝජනවල ශුද්ධ වටිනාකමෙනි.

3.10 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LAKAS) 07- මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශ වක්‍ර ක්‍රමය යටතේ පිළියෙල කෙරේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, සේවකයෙකු සඳහා වගකීමක් පැන නඟිනුයේ වසර එකක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළහොත් පමණි. මෙම බැඳීම බාහිර වශයෙන් මූල්‍යයනය නොකෙරේ.

4 සේවක ප්‍රතිලාභ

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්- විශ්‍රාමික පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා සංස්ථාවේ ශුද්ධ වගකීම සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපාදන නිර්ණය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් ගණනය කෙරේ. මෙම ගණනය කිරීම වසර තුනකට වරක් සුදුසුකම්ලත් ස්වාධීන ආයුගණකවරු විසින් සිදු කෙරේ. මිනුම්කරණය කළ ආයුගණක ලාභ/ අලාභ අන්තර්ගත ශුද්ධ ප්‍රතිලාභ වගකීම ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ වහාම හඳුනාගැනේ.

ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) මීට ඇතුළත් වේ. අදාළ ආඥා පනත් සහ රෙගුලාසි වලට අනුකූලව එම අරමුදල්වලට දායකත්වය දැරීම සඳහා සේවකයන සුදුසුකම් ලබයි.

5 වගකීම් සහ ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් පැන නැඟුන වර්තමාන නෛතික/ ගිවිසුම්ගත බැඳීමක් තිබේ නම් වගකීම් සහ ප්‍රතිපාදන ශේෂ පත්‍රයේ හඳුනා ගන්නා අතර එවිට සමූහයේ ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් පිටතට ගලා යාමක් අපේක්ෂා කෙරේ. ණය හිමියකු විසින් ඉල්ලුම් කළ විට හෝ ශේෂ පත්‍ර දිනයෙන් වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍ර දිනයේ සිට වසරකින් පසු ගෙවිය යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් ලෙස සැලකේ.

අ) වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පිරිවැය මත සඳහන් කෙරේ.

ආ) හිමිකම් සඳහා අවිනිශ්චිත ප්‍රතිපාදන

අපගේ අතීත අත්දැකීම් අනුව මෙරටින් බැහැර වීමේ පිරිවැය ආවරණය කරමින් ලබාදෙන බැංකු ඇපකර සඳහා හිමිකම් ගෙවීමේ අනුපාතිකය, ලැබී ඇති රක්ෂණ වාරිකවලින් 30%ක වැනි පරාසයක පවතී. රක්ෂණ වාරික ලැබීමේ දින සිට වසර තුනක කාල සීමාවත් මුළුල්ලේ විහිදී යන වාරික සඳහා හිමිකම් වගකීමක් පවතී. එම අතීත අත්දැකීම් අනුව, මෙරටින් බැහැර වීමේ පිරිවැය ආවරණය කරමින් ලබාදෙන බැංකු ඇපකර සඳහා පිළිවෙලින් 15%, 10% සහ 5% යන අනුපාතිකවලින් වසර තුනක් කාලසීමාවක් සඳහා ලැබී ඇති රක්ෂණ වාරිකවලින් 30%ක් දක්වා වූ වෙන් කිරීමක් අවිනිශ්චිත හිමිකම් සඳහා ප්‍රතිපාදන වශයෙන් සැපයේ.

වසර අවසානයේ පිළිඹිබුවන ශේෂ සමඟ අනුකූලවීම සඳහා සෑම වසරකදීම ප්‍රතිපාදනය සඳහා ගැලපුම් සිදුකළ හැකි ය. අනෙකුත් රක්ෂණ වර්ග සඳහා ප්‍රතිපාදන සැලසීම පහත පදනම්න් සිදුකර තිබේ.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්සුව	15%
ATA Carnet System ඔස්සේ ආවරණය	-
කෙරෙන සෘජු අපනයන කාර්යසාධන ඇපකරය	2%
පූර්ව නැවිගත කිරීම් ණය ඇපකරය	12%
පශ්චාත් නැවිගත කිරීම් ණය ඇපකරය	5%

අ) වාර්තාකරන ලද හිමිකම් සඳහා ප්‍රතිපාදන

මෙම ප්‍රතිපාදන වෙන් කිරීමේ දී වාර්තා කරන ලද හිමිකම් හඳුනාගෙන ඒවා සැලකිල්ට ගනී. සාධාරණ යැයි හැඟේ නම්, ශේෂ පත්‍ර දිනයට පවත්නා තත්ත්වයන් මත හිමිකම් සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් වෙන් කෙරේ. හිමිකමක් සිදුකළ යුතු බවට සම්භාවිතාවයක් පවතින බවට සාක්ෂි සහ සහතික කිරීම් පවතී. හිමිකම් ගෙවීම් ඉන් අනතුරුව වෙන්කරන ලද ප්‍රතිපාදනවලට හිලව් කෙරේ. හිමිකම් සඳහා වන වගකීම්වලට භාව්‍ය සිදුවීම් හටගැනීම මත අඛණ්ඩව ප්‍රතිපාදන වෙන් කිරීම පදනම් වේ.

ආ) ඉතිරිව ඇති අවදානම් මත නොඉපයූ වාරික සඳහා සංචිතය

සමාලෝචිත වර්ෂය තුළ දී ලියාහල සහ ලැබූ වාරික සහ එසේ රැස්කරන ලද වාරික මත ඉතිරිව ඇති අවදානම ආවරණ කාලසීමාව පුරා පැතිර යන අතර, එහිදී වාරිකයෙන් කොටසක් ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ද අදාළ වේ. රක්ෂණ ව්‍යාපාරයේ සම්මතයන්ට අනුකූලව, ප්‍රවර්තන මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් අනතුරුව ආවරණ කාල සීමාව සඳහා වාරිකය සමානුපාතිකව වෙන් කිරීම මඟින් සංචිතයක් ගොඩ නැංවේ. සංචිතය නිර්ණය කිරීම සඳහා 1/365 ක්‍රමවේදය යොදාගන්නා ලදී.

අපනයන ගෙවීම් රක්ෂණ ඔප්සු මත වාරික වාරික රැස්කිරීමේ දී, ඉතිරිව ඇති අවදානම මත සංචිතයේ තත්‍ය ආවරණය සැලකිල්ලට ගනී. ආවරණ කාල සීමාව ආශ්‍රිතව පවතින අවදානම්වල සංකීර්ණබව, ස්වභාවය සහ ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉතිරිව ඇති අවදානම සඳහා සංචිතයක් වශයෙන් ඇපකර මත එකතු කරන ලද රක්ෂණ වාරිකවලින් 15%ක් වෙන් කර තිබේ.

6 ආදායම

6.1 වාරික ආදායම

වසර අවසානය දක්වා භාර දී ඇති සියලුම ප්‍රකාශ සැලකිල්ලට ගෙන 'උපචිත පදනමින්' වාරික ආදායමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලැබේ. ගිවිසුම්වලින් එක් එක් පුද්ගලයන් සඳහා බලපාන කොන්දේසි මත පදනම්ව අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම වෙනස් වේ.

6.2 අනෙකුත් මෙහෙයුම් ආදායම්

අ) දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභ සහ පාඩු

දේපළ, පිරියත සහ උපකරණ භාවිතයෙන් ඉවත් කිරීම හෝ බැහැර කිරීම ඔස්සේ ලාභ හෝ පාඩු, එකී විකිණීම් සිදුකරන කාලසීමාව තුළම හඳුනාගන්නා අතර අනෙකුත් මෙහෙයුම් ආදායම් ලෙස වර්ගීකරණය කෙරේ.

6.3 වියදම් හඳුනාගැනීම

අ) ආදායම් වියදම්

ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කරන ආකාරයෙන් සංස්ථාව විසින් උපයාගත් ලාභය යනු සියලුම

හඳුනාගත් වගකීම් සහ දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය කිරීම්වලට ප්‍රතිපාදන වෙන්කිරීමෙන් පසුව වේ.
ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමවේදය ක්‍රියාත්මක වීම ඔස්සේ ආයතනයේ කාර්ය සාධනය සාධාරණ අයුරින් ඉදිරිපත්වන බව අධ්‍යක්ෂවරුන් විසින් දරන මතය වන බැවින් මෙම ක්‍රමවේදය අනුගමනය කරනු ලැබේ.

ආ) ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාවය වැඩි කිරීමේ කාර්යය සඳහා ස්ථීර ස්වභාවයෙන් වත්කම් ව්‍යාප්ත කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වැයකරන වියදම් ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලැබේ.
දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු, ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කෙරේ.

6.4 බදුකරණය

ආදායම් බදු වියදම්

සංස්ථාවේ සමස්ත මෙහෙයුම් මත වන බදු වලින් වර්ෂය සඳහා ආදායම් බදු වියදම් සමන්විත වේ. වාර්තා කරන දිනයට බලාත්මක කර ඇති හෝ බොහෝ දුරට බලාත්මක බදු අනුපාතිකයන් උපයෝගී කරගෙන වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම මත ගෙවීමට අපේක්ෂිත බදු මුදල ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබන අතර පෙර වර්ෂයන් සඳහා ගෙවිය යුතු බදු සඳහා යම් ගැලපීමක් වේ නම් එය ද හඳුනාගනු ලැබේ. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව, බදුකරණ කාර්යය සඳහා ගැලපුම්කළ වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය මත බදුකරණයට අදාළ ප්‍රතිපාදන සිදු කෙරේ.

6.5 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය ඒවා දැරූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

6.6 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සමඟ අනුකූලවීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

6.7 අසම්භාව්‍ය වත්කම් හා බැඳීම්

අසම්භාව්‍ය වත්කම් හා බැඳීම් යනු සංස්ථාවේ පාලනයෙන් බැහැර වූ අවිනිශ්චිත අනාගත සංසිද්ධිවල සිදුවීම් හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කළ හැකි අතීත සංසිද්ධියකින් පැන නඟින විභව්‍ය වත්කමක් හෝ බැඳීමකි.

6.8 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවූ සියලු ප්‍රමාණාත්මක සිද්ධි අවධානයට යොමුකර අනාවරණය කර තිබූ අතර අදාළ පරිදි ගැලපුම් සිදුකරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

විගණකාධිපති විසින් 2024 ජූනි 07 දිනැති අංක TAC/E/SLECIC/2023/23 දරන ලිපිය මඟින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සභාපති වෙත යොමුකළ එම සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සිංහල පරිවර්තනය

සභාපති
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

.....

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS -16 - දේපළ, පිරියත සහ උපකරණ සඳහා අනුකූලතාවයට අදාළව පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(i) ප්‍රමිතියේ 79 (ආ) ඡේදය ප්‍රකාරව, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළයුතු වුව ද, සම්පූර්ණයෙන් ක්ෂය කර තවමත් භාවිතයේ පවතින ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් 01, කාර්යාල උපකරණ 61, පරිගණක සහ මෘදුකාංග පැකේජ 11කට අදාළව ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ 55 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම එය භාවිතය සඳහා සූදානම් තත්ත්වයට ගෙන ඒමත් සමඟ ආරම්භ වන අතර වත්කම විකිණීම සඳහා තබා ඇති හෝ ඉවත් කළයුතු වශයෙන් වර්ගීකරණය කිරීම යන දෙකෙන් කලින් එළඹෙන දිනයේ දී වත්කම ක්ෂය කිරීම නවතා දැමේ. එසේ වුව ද සංස්ථාව විසින්, සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගත් පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර අයිතම 21, ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් අයිතම 31 සහ කාර්යාල උපකරණ අයිතම 10 කට අදාළව අදාළ අයිතම මිලදී ගත් වර්ෂයේ දී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ අතර සහ ඉවත් කරන වර්ෂයේ දී ක්ෂය කිරීම සිදුකර නොතිබුණි. ඒ අනුව, ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සමාලෝචිත වර්ෂයේ දී රු. 2,779,165 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වර්ෂය සඳහා පොළිය නිරවද්‍ය ආකාරයෙන් ගණනය කර නොතිබූ හෙයින්, ලැබිය යුතු පොලී ආදායම රු.864,214ක් අඩුවෙන් ද, පාරිතෝෂික අරමුදල මත භාණ්ඩාගාර බිල්පත් ගිණුමේ ශේෂය රු.1,239,755ක් අඩුවෙන් ද වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම රු.2,103,969 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2022 වර්ෂය සඳහා අදාළ රු.987,422ක ආදායමක් සමාලෝචිත වර්ෂයේ අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පුවල දළ ප්‍රකාශිත වාරිකවල ඇතුළත් වී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පුවල දළ ප්‍රකාශිත වාරික එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) රු.13,116,062ක් වූ අපනයනකරුවන් 09 දෙනෙකුට අදාළ අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පුවල උපයා නොගත් වාරිකවල වටිනාකම රු.8,717,960 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පුවල 2023 දෙසැම්බර් 31 දිනට උපයා නොගත් වාරිකවල වටිනාකම රු.4,398,102ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2023 වර්ෂය සඳහා රු.60,366,742ක වටිනාකමකින් යුතු ශුද්ධ හිමිකම්, රු.62,831,747ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ හිමිකම් රු.2,465,005කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2023 දෙසැම්බර් 31 වැනි දිනට ඉදිරියේ දී ගෙවිය යුතු හිමිකම් සඳහා වෙන්කිරීම්වල ඉතිරි වූ ප්‍රතිපාදන යටතට පසුගිය වර්ෂවලට අදාළව හිමිකම් සඳහා ඉල්ලීම් නොකරන ලද හිමිකම් සහ ගෙවන ලද සහ ප්‍රතික්ෂේපිත වූ හිමිකම් වලට අදාළව එකතුව රු.306,856,067 ක් ඇතුළත් ව තිබුණි. එබැවින්, 2023 දෙසැම්බර් 31 වැනි දිනට ඉදිරියේ දී ගෙවිය යුතු හිමිකම් සඳහා වෙන්කිරීම් රු.306,856,067කින් වැඩියෙන් දක්වා තිබූ අතර එම වටිනාකමට සමාන අගයකින් රඳවාගත් ඉපැයුම් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) බදු අයකළ හැකි ආදායම නිරවද්‍ය ආකාරයෙන් ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු රු.2,468,303ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල සහ විගණනයට ඉදිරිපත්කළ උපලේඛනවල පහත වෙනස්වීම් නිරීක්ෂණය විය.

විස්තරය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	ඉදිරිපත් කළ උපලේඛන අනුව වටිනාකම රු.	වෙනස රු.
ගෙවූ හිමිකම්	40,574,275	40,902,576	328,301
ශුද්ධ හිමිකම්	62,831,747	166,611,769	103,780,022

(එ) පහත ගිණුම් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක අයුරින් සහතික කිරීම හෝ පිළිගැනීම සිදුකළ නොහැක.

	විස්තරය	වටිනාකම (රු.)	ඉදිරිපත් නොකළ සාක්ෂි
(i)	භාණ්ඩාගාර තැන්පතුවෙන් ලැබිය යුතු පොළිය	67,154,145	ලැබුණු බවට තහවුරු කිරීමක්
(ii)	2023 දෙසැම්බර් 31 වැනි දිනට හැටන් නැෂනල් බැංකුවේ ඒක්ෂණ ගිණුමේ ශේෂය	13,428,928	ශේෂය පවතින බවට තහවුරු කිරීමේ ලේඛනය

(iii)	සමාලෝචිත වර්ෂයේ ක්ෂය කිරීම්	4,574,094	මිලදී ගත් දිනය, භාවිතය සඳහා සූදානම් දිනය හෝ වත්කම් ප්‍රත්‍යාගණනය කළ දිනය
	එකතුව	**85,157,167**	

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීම යි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නොමැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විසින් සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දීමෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්;

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන්මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා සිදුවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට සංස්ථාව විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ) (i) හි විගණන කරුණ හැර, ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ සිදුකිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර, යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

	නීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වැනි වගන්තිය සහ 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ පනතේ 21(2) වගන්තිය	සංස්ථාව විසින් සිදුකළ රු.4,907,943,668ක ආයෝජනයට අදාළව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය සහ අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය සංස්ථාව විසින් ලබාගෙන නොතිබුණි.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය යටතේ නිකුත් කළ යහ පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.3 ඡේදය	සංස්ථාවේ ව්‍යාපාරික මෙහෙයුම් මත මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීමට සහ එවැනි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම සඳහා අවදානම් කමිටුවක් පත්කර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය යටතේ නිකුත් කළ මෙහෙයුම් මාර්ගෝපදේශ	
	(i) 3.3 ඡේදය	සංස්ථාව විසින් මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබුණි.
	(ii) 3.4 ඡේදය	සංස්ථාව විසින් අනුක්‍රමික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ඈ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත	පාරිතෝෂිකය ගණනය කිරීමේ දී, ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවන වියදම් දීමනාව හෝ එ ඒ හා සමාන වෙනත් දීමනාවක් ලෙස සැලකිය නොහැකි රු.15,000 සහ රු.7,500 වටිනාකම්වලින් පැවති දීමනා මූලික වැටුපට එකතු කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී රු.1,023,750ක අතිරේක මුදලක් සේවකයන් සිව් දෙනෙකු සඳහා පාරිතෝෂික වශයෙන් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇතිබව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2023 ජූලි 04 දිනැතිව පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී (COPE), මීට පෙර අවස්ථාවන්හි දී සංස්ථාවේ සිදුවූ අයථා ක්‍රියාවන්ට අවධානය යොමුකරමින්, සියලුම පුරප්පාඩු ස්ථිර පදනමින් පිරවීම සඳහා නියෝග කරන ලදී. එසේ වුව ද, සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරුවලින් 21ක් සඳහා බඳවා ගැනීම් 2023 දෙසැම්බර් 31 වන දිනය වනවිට ද සිදුකර නොතිබුණි.

(ආ) මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන් සමඟ රැස්වීම් 06ක්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්යාංශයේ දී භෞතික වශයෙන් හෝ ටෙලි/වෙබිනාර් ආකාරයෙන් සංක්‍රමණික සේවකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 20ක් සහ පළාත් 04ක දී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ දැනට පවතින නිපැයුම් සම්බන්ධයෙන් විභව්‍ය සහ දැනට සිටින අපනයනකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ දී සැලසුම් කර තිබුණි. එසේ වුව ද, එම සෑම කාර්යයකින්ම එක් වැඩසටහනක් පමණක් බැගින් පවත්වා තිබුණි.

(ඇ) අපනයන බිල්පත් වට්ටම් කිරීමේ පහසුකම යටතේ අපනයනකරුවන් 08 දෙනෙකු වෙත ලබා දී තිබූ රු.34,958,636ක අත්තිකාරම් මුදල වසර 15ක් මුළුල්ලේ පියවීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර, මෙයින් රු.22,870,492 ක මුදලක් එක් අපනයනකරුවෙකු වෙත ලබා දී තිබුණි.

(ඈ) රු. 2,185,511ක් වූ මූල්‍ය සේවා වෙනුවෙන් ලැබිය යුතු වැට බද්ද වසර 06ක් මුළුල්ලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සංස්ථාව විසින් පුරප්පාඩු 05ක් පිරවීම සඳහා රු.815,810ක මුදලක් වැය කරමින් පුවත්පත් දැන්වීම් පළ කරන ලදී. එසේ වුව ද, නව බඳවා ගැනීමේ පටිපාටියට අනුව එම පුවත්පත් දැන්වීම් සකස්කර නොතිබූ බව පසුව අනාවරණය විය. ඒ අනුව, එම කාර්යය සඳහා රු.793,500ක් වැය කරමින් නැවත පුවත්පත් දැන්වීම් පළ කිරීමට සංස්ථාවට සිදුවිය. එබැවින්, මුලින් වැය කරන ලද රු.815,810ක මුදල අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

අත්/කළේ. ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති